(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 2(7).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2016 අප්‍රේල් මස 07 වැනි බ්‍රහස්පතින්දා**

## 2016 මැයි මස 03 වැනි අඟහරුවාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

මුදල් අමාත්‍යතුමා,— වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියෝග,— 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2016 ජනවාරි 01 දිනැති අංක 1947/47 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.04.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරය වන) සුරාබදු ආඥාපනතේ, 32 වැනි වගන්තිය සමග කියවනු ලබන 22 වැනි වගන්තිය යටතේ ඊතයිල් මධ්‍යසාර මත සුරාබදු සංශෝධනය කිරීම සහ ඊතයිල් මධ්‍යසාර ආනයනය කිරීමට බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2016 මාර්තු 02 දිනැති අංක 1956/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.04.06 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 988 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— ප්‍රමිති හා සේවා පනත යටතේ නියෝග,— 1995 අංක 35 දරන මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනතේ 60 වැනි වගන්තිය යටතේ ආහාර සුරක්ෂිතතාව අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ජූලි 2 දිනැති අංක 1921/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.04.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

## 2016 මැයි මස 06 වැනි සිකුරාදා

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා.7/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම,— සියලුම දේශපාලන පක්ෂ නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත විශේෂ කාරක සභාවක් පත්කොට ශ්‍රී ලංකාවට යෝග්‍යවූ ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම ආරම්භ කළ යුතුයැයි ද, ඒ සඳහා ඒ හා සබැඳි සියලු ක්ෂේත්‍රයන් නියෝජනය වන පරිදි ප්‍රවීණයන්, උගතුන් හා බුද්ධිමතුන්ගෙන් මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි සහාය ලබා ගත යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.8/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රජයේ පාසල් හා විශ්වවිද්‍යාල නිවාඩු දිනවලදී එම මධ්‍යස්ථාන අධ්‍යාපන ඒකක සඳහා ලබාදීම,— රජයේ පාසල් නිවාඩු කාලයේදී සහ සවස් වරුවලත් විශ්වවිද්‍යාල නිවාඩු දිනවලත් එම මධ්‍යස්ථාන මුල් කොට ගෙන ව්‍යාපාරික ප්‍රජාව, රාජ්‍ය නොවන සංවිධාන, වාණිජ මණ්ඩල, ප්‍රජා මූල සංවිධාන සම්බන්ධ කර ගන්නා වූ පුළුල් වැඩපිළිවෙළක් වශයෙන් වැඩිහිටි හා නොවිධිමත් අධ්‍යාපන ඒකක සහනදායී ගාස්තු පදනමක් මත ආරම්භකළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.9/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පුරප්පාඩු වන ග්‍රාම නිලධාරී තනතුරු වල වැඩ බැලීමේ පත්වීම් සඳහා කාර්යක්ෂම වැඩපිළිවෙළක් සකස් කිරීම,— ග්‍රාම නිලධාරී තනතුරක පුරප්පාඩු ඇති වූ විට ආසන්න ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරීවරයා වැඩ බැලීම සඳහා පත් කරනු ලබන්නේ ඉතා සුළු දීමනාවක් යටතේ බැවින් ද, මෙම වැඩ බැලීමේ පත්වීම් තුළින් ග්‍රාම නිලධාරී වසම් දෙකෙහිම කාර්යක්ෂමතාව බිඳ වැටෙන බැවින්ද, එම තත්වය මග හරවා ගැනීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ග්‍රාම නිලධාරී සංචිතයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ පිහිටුවිය යුතු අතර පුරප්පාඩු සිදුවන වසම සඳහා එකී සංචිතය තුළින් ග්‍රාම නිලධාරීන් පත් කිරීම සහ එම සංචිතය තුළ සිටින ග්‍රාම නිලධාරීන්ට ප්‍රාදේශීය ලේකම් විසින් පවරනු ලබන වෙනත් ඵලදායී ක්ෂේත්‍ර හෝ රාජකාරී සඳහා යෙදවීමේ වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.10 /'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වර්තමානයේ ක්‍රියාත්මක වන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දීම,— සෑම ග්‍රාම නිලධාරී වසමකම පිහිටා ඇති ආගමික සිද්ධස්ථානයන්හි නායක ස්වාමීන්වහන්සේ, පූජකතුමා, විදුහල්පතිතුමා, ග්‍රාම නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ සහකාරවරයා, ජන සභා ලේකම්වරු, ප්‍රදේශයේ පොලිස් ස්ථානය නියෝජනය කරන නිලධාරියකු සහ එම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ස්වේච්ඡා සංවිධාන, රාජ්‍ය හා පෞද්ගලික අංශ වල සේවය කරන අදාළ වසමේ පදිංචිව සිටින නියෝජිතයින්ගෙන් සමන්විත සිවිල් ආරක්ෂක කමිටු ගොඩනැගීමට වඩාත් පහසුවීම සඳහා වර්තමාන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දිය හැකි පරිදි පාර්ලිමේන්තු පනතක් සම්මත කළ යුතු යැයි ද, ඒ තුළින් ග්‍රාම නිලධාරී වසම තුළ සිදුවන අපරාධ හා දුරාචාර, නීති විරෝධී කටයුතු පිළිබඳ අදාළ අංශ සමඟ මනා සම්බන්ධීකරණයක් ගොඩනැගීමට හැකි වන පරිදි අදාළ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.11/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— දිවයින තුළ දැනට ක්‍රියාත්මක වන යල් පැන ගිය නීති අණපනත් යාවත්කාලීන කිරීම,— ශ්‍රී ලංකාවේ මේ වනවිටත් අධිරාජ්‍යවාදී යුගයේදී හඳුන්වාදෙන ලද නීති අණපනත් ක්‍රියාත්මකවන බැවින් එම නීති අණපනත් යළි අධ්‍යනය කිරීමේ කමිටු පත්කර, යල් පැනගිය දඬුවම්, දඩ මුදල් ආදිය යාවත්කාලීන කිරීමේ ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.12/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ එකම දිනක පැවැත්වීම,— ශ්‍රී ලංකාව තුළ1988 සිට 2010 දක්වා වසර 22ක කාලය තුළ 1990, 1992, 1995, 1996, 1998, 2003 සහ 2007 වසරවලදී හැර අන් සෑම වසරකදීම කිසියම් මැතිවරණයක් පවත්වා ඇති අතර, එසේ මැතිවරණ පැවැත්වීම ජනතා මතය සලකා බැලීම සඳහා වටිනා නිර්ණායකයක් වුවද, මේ තුළින් රටේ ආර්ථිකය, පරිපාලනය ආදි සෑම ක්ෂේත්‍රයකටම දැඩි බලපෑමක් ඇති කරන බැවින් පළාත් පාලන මැතිවරණ, මහා මැතිවරණ සහ ජනාධිපතිවරණය එකම දිනයකදී පැවැත්වීමට හැකි වන පරිදි එකී ආයතනවල නිල කාලය සංශෝධනය කිරීමටත්, ගැලපෙන මැතිවරණ ක්‍රමවේදයක් නිර්මාණය කිරීමටත් සුදුසු පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.13/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම,— රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව පාර්ලිමේන්තුව හා පළාත් සභා අතරත්, පළාත් සභා හා පළාත් පාලන ආයතන අතරත් මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම අත්‍යාවශ්‍ය වන අතර ඒ සඳහා පළාත් පාලන ආයතන ප්‍රධානීන්, පළාත් සභා තුළ නියෝජනයවීම සහතිකවනු පිණිස ද, පළාත් සභා ප්‍රධානීන් පාර්ලිමේන්තුව තුළ නියෝජනය වීම සහතිකවනු පිණිසද ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.14/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඒකාග්‍රතාව ඇති කිරීමට පියවර ගැනීම,— ජාතික ඒකාග්‍රතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දෙමළ භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල සිංහල භාෂා පුහුණු වැඩසටහන් ද, සිංහල භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල දෙමළ භාෂා පුහුණු වැඩසටහන් ද, රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික ආයතනයන්හි සහයෙන් ක්‍රියාත්මක විය යුතු අතර රාජ්‍ය හා පෞද්ගලික විද්‍යුත් මෙන්ම මුද්‍රිත මාධ්‍ය ආයතනවල සහයෝගය ලබාගනිමින් මෙම පුහුණු වැඩසටහන් ආරම්භ කිරීම සඳහා ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.15/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කලත්‍රයාගේ නොමනා ක්‍රියා නිසා අසරණභාවයට පත්වන පාර්ශවයට සහන සලසා දීම,— විවාහක අඹුසැමි යුවලක් එකම වහලක් යට ජීවත්ව සිටින අවස්ථාවලදී පුරුෂයා හෝ බිරිඳ සුරාව, සූදුව සහ වෙනත් අපචාරී කටයුතුවල යෙදෙමින් ඉඩම් හෝ ගේ දොර බඩු මුට්ටු තම පෞද්ගලික අභිමතය පරිදි විකුණමින් හෝ අන් අයට පවරමින් හැසිරීම නිසාවෙන් අනෙක් පාර්ශවයත් සමඟ දරුවන් දැඩි අසරණභාවයට පත් වන අවස්ථාවලදී එම තත්වය වළක්වා ගැනීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.16/'15

ගරු බුද්ධික පතිරණ මහතා,—චර්යා ධර්ම පිළිබඳ කාරක සභා ඇතිකිරීම,— ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්වාසවන්තභාවය හා ඔවුන් තුළ උසස් ආචාර ධර්ම පවත්වාගෙන යාමේ අවශ්‍යතාව නිසා ඒ පිළිබඳ කරුණු සොයා බැලීම සඳහා චර්යා ධර්ම පිළිබඳ කාරක සභාවක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.17/'15

ගරු බුද්ධික පතිරණ මහතා,—නව ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පතක් නිකුත් කිරීම,— පරිපාලනය පහසු කිරීම, අපරාධ මැඩලීම සඳහා හා වෙනත් වංචනික ක්‍රියාවලට යොමුවීම අවමකිරීම සඳහා අදාළ පුද්ගලයාගේ රුධිර ගණය, බැංකු ගිණුම්, ක්‍රෙඩිට් කාඩ්, අධ්‍යාපන සුදුසුකම්, රියදුරු බලපත්‍ර හා විදේශ ගමන් බලපත්‍ර අංක ආදී වැදගත් හා අවශ්‍ය තොරතුරු ඇතුළත් නව ඉලෙක්ට්‍රොනික අංකයක් සහිත ජාතික හැඳුනුම්පතක් නිකුත් කළ යුතු බවත් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයන්හි ජීවත්වන සියලු දෙනාගේ තොරතුරු ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් පරිගණකගත කිරීම කඩිනමින් කළ යුතු බවත් එම තොරතුරු වරින්වර යාවත්කාලීන කළයුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.18/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පොලිස් නිලධාරීන්ට ද අවුරුදු විස්සක සේවා කාලයකින් පසු විශ්‍රාම යාමට අවස්ථාව ලබාදීම,— පොලිස් දෙපාර්තමේන්තුවේ කාන්තා පොලිස් නිලධාරිනියන් සඳහා වන විසි වසරක සේවා කාලයකින් පසු ස්ව කැමැත්තෙන් විශ්‍රාමයාමේ හැකියාව, පොලිස් නිලධාරීන් සඳහා ද අදාළ වියයුතු යැයි ද ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.19/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කිරීම,— රෙගුලාසි තැනීම මෙන්ම රෙගුලාසි ඉවත් කිරීමද නිතර සිදුවන ක්‍රියාවලියක් බැවින් කල්පැන ගිය රෙගුලාසි ඉවත් කිරීම පිළිබඳ සොයා බැලීම සඳහා රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.21/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සහතික වීම පිළිබඳ කාරක සභා ඇති කිරීම,— පාර්ලිමේන්තුවේ අසන ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් රජය දෙන සහතික හා රජයේ බැඳීම් ඇතැම් විට කඩ වන අවස්ථා දක්නට ලැබෙන බැවින්, රජය සිය වගකීම් ඉටු කරන බවට සහ ඒවා පිළිබඳව වගකියන බවට සහතික වීම සඳහා සහතික වීම පිළිබඳ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.22/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඵලදායීතාව වැඩිකර ගැනීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඇති අනවසර ඉදිකිරීම් හා අනවසර පදිංචිකරුවන් කඩිනමින් ඉවත්කර නීත්‍යානුකූල ඉදිකිරීම් සම්බන්ධ ගිවිසුම් නැවත සමාලෝචනය කිරීමෙන් දෙපාර්තමේන්තුවට ලැබෙන ආදායම් වර්ධනය කළ යුතු අතර, දෙපාර්තමේන්තුවේ සංවර්ධන කටයුතු සඳහා ඍජුවම බල නොපාන්නා වූ ඉඩම් දිගුකාලීන බදු පදනමක් මත පෞද්ගලික අංශයට ලබාදී එම මුදල් දුම්රිය පද්ධතිය නවීකරණය සඳහා යොදා ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.23/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— යාචකයින්ගේ ජීවිත ආරක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— මේ වන විට යාචකයින්ගේ ජීවිතවලට විශාල ලෙස තර්ජන එල්ල වී තිබෙන බැවින් ඔවුන්ගේ ජීවිතවල සුරක්ෂිතතාව රැකදීම උදෙසා, ඔවුන්ට වගා කිරීම සඳහා ඉඩම් ලබා දී ඉන් ලැබෙන ආදායමෙන් ඔවුන්ගේ ජීවිතවල ආරක්ෂාව හා පෝෂණය සහතික කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.24/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීමේ අරමුණින්, රජය මගින් භූමි ප්‍රමාණයක් වෙන්කොට එම ස්ථානයට නිදැල්ලේ යන සුනඛයින් ගෙන ගොස් ඔවුන් රැක බලාගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.25/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ළමා අපචාර සිද්ධීන් සඳහා දැඩි දඬුවම් පැනවීම,— දිවයින පුරා ළමා අපචාර හා අපයෝජනයන් දිනෙන් දින සීඝ්‍රයෙන් වර්ධනය වීමේ තත්ත්වයක් ඇති වී තිබෙන බැවින් ඒ සම්බන්ධව දැනට පවත්නා නීති රෙගුලාසි ප්‍රමාණවත් නොවන්නේ නම්, නව නීති රෙගුලාසි අලුතින් සම්මත කොට ඉතා කඩිනමින් මේ සම්බන්ධ නඩු විසඳීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.26/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා වෙරළ පිවිසුම් මාර්ග ඇති කිරීම,— දිවයිනේ වෙරළබඩ කලාපය තුළ සීඝ්‍රයෙන් සිදුවන ඉදිකිරීම් නිසාවෙන් දේශීය, විදේශීය සංචාරකයන්ට මෙන්ම ධීවරයන්ට ද වෙරළ තීරයට පිවිසීමේදී අවහිරතා ඇතිව තිබීම සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනයට මෙන්ම ධීවර කර්මාන්තයට ද බාධා ගෙන දෙන බැවින් එම තත්ත්වය වළක්වාලීම සඳහා මෙන්ම මෙම ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව වෙරළ පිවිසුම් මාර්ග පද්ධතියක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.27/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— විදුහල්පති සේවය, ගුරු අධ්‍යාපන සේවය, අධ්‍යාපන පරිපාලන සේවය යන සේවාවල දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින්, එම තත්ත්වය මඟ හරවා ඔවුන්ගේ ආත්මාභිමානයට සරිලන වැටුපක් ලැබෙන පරිදි වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.28/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ භික්ෂු අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම,— බෞද්ධ භික්ෂූන්වහන්සේලාගේ ධර්ම ඥානය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව උන්වහන්සේලාගේ කථන හැකියා, ශ්‍රවණ හැකියා, පරිගණක, මනෝවිද්‍යාත්මක සහ උපදේශනය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම උදෙසා දැනට පවත්නා භික්ෂු අධ්‍යාපන ආයතනවලට පරිබාහිරව මෙම කටයුතු සඳහාම වෙන් වූ භික්ෂු අධ්‍යාපන ආයතන ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.29/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක වන නොතාරිස් සේවාව යාවත්කාලීන කිරීම,— දිවයින තුළ ක්‍රියාත්මක වන නොතාරිස් සේවය යල්පැන ගිය නීතිවලින් සකස් වී ඇති නිසා ඒ පිළිබඳව යළි සලකා බලා වර්තමානයට ගැලපෙන ලෙස නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.30/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වියළි කලාපීය හේන් ගොවීන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— වියළි කලාපීය ප්‍රදේශවල හේන් ගොවීන් විසින් වගා කරනු ලබන වී, කුරක්කන්, මුං, තල වැනි වගාවන්හි අස්වැන්න වැඩි කර ගැනීම සහ නිෂ්පාදන සකස් කිරීම සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම තුළින් උසස් ගුණාත්මක තත්ත්වයෙන් යුතු නිෂ්පාදන සකස් කිරීම සඳහාත්, දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ තුළ නිෂ්පාදන අලෙවි කර ගැනීමේ පදනම ශක්තිමත් කර ගැනීම සඳහාත් සීමිත සමූපකාර සමාගම් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.31/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ගුරු උපදේශක සේවාවක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණ ඇතිව මීට වසර විස්සකට (20) පමණ පෙර සිට ආරම්භ වී ක්‍රියාත්මක වන ගුරු උපදේශක තනතුරු වෙනම ගුරු උපදේශක සේවා ඒකකයක් ලෙස ස්ථාපනය කල යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.32/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— තිරිඟු පිටි වෙනුවට සහල් පිටි ජනතාව අතර ජනප්‍රිය කරවීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම,— තිරිඟු පිටි සඳහා විදේශ රටවලට ඇදී යන විශාල ධනස්කන්ධය නවතාලීමේ අරමුණ ඇතිව ආදේශකයක් ලෙස භාවිතා කළ හැකි සහල් පිටිවලින් සැකසූ ආහාර ප්‍රචලිත කිරීම සඳහාත්, කෙඳි සහිත ධාන්‍ය වර්ගයක් වන සහල් වඩාත් සියුම් ලෙස තිරිඟු පිටි මෙන් අඹරා ගැනීම සඳහාත්, තිරිඟු පිටි ඇඹරීමට භාවිතා කරන ආකාරයේ යන්ත්‍ර සූත්‍ර සහ නව තාක්ෂණය හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.33/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— යුද්ධය නිසා ආබාධිතයන් බවට පත්වූවන්ට සහන සලසා දීම,— වසර 30කට ආසන්න කාලයක් පැවැති යුද්ධය හේතුකොට ගෙන එදිනෙදා කුලී වැඩ කොට ජීවත් වූ ජනතාවත් ස්ථිර රැකී රක්ෂා කළ ජනතාවත් අතරින් සැලකිය යුතු ප්‍රමාණයක් අංගවිකලව ආබාධිතව ජීවන බරින් මහත් පීඩාවට පත් වී අසරණව ජීවත් වන බැවින්, ඔවුන් සඳහා යම් මාසික දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.34/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලුම ප්‍රභූ ආරක්ෂකයින් සඳහා ගමන් වියදම් දීමනාවක් ලබා දීම,— ජනාධිපති ආරක්ෂක සහ අගමැති ආරක්ෂක සේවයේ නියුක්ත නිලධාරීන්ට මෙන්ම අනෙකුත් ප්‍රභූ ආරක්ෂක සේවාවල නියුක්ත නිලධාරීන්ට ද සමාන ගමන් වියදම් දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.35/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන පාඨමාලාවන් රැකියාභිමුඛ පාඨමාලාවන් බවට පත්කිරීම,— දිවයිනේ සියලුම රජයේ විශ්වවිද්‍යාල සහ පෞද්ගලික විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන ශාස්ත්‍රීය අධ්‍යාපනයම සඳහා වූ උපාධි පාඨමාලාවන් රැකියාභිමුඛ වෘත්තීයමය උපාධි පාඨමාලාවන් බවට පරිවර්තනය කර එමගින් බිහිවන්නා වූ උපාධිධාරීන් වෙත නව රැකියා සපයා දීමේ අරමුණ ඇතිව, සියලුම විශ්වවිද්‍යාල සමඟ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ආයතන සම්බන්ධීකරණය සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.36/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් සිසුන් ප්‍රවාහනය කරනු ලබන වෑන් රථ සඳහා නිසි ප්‍රමිතීන් නියම කිරීම,— දිවයින පුරා පවත්වාගෙන යනු ලබන පාසල් සිසු ප්‍රවාහන සේවාවන් නියමිත ප්‍රමිතියෙන් නොපවතින බැවින් සහ ඇතැම් පාසල් වෑන් රථ සේවකයින්ගේ පැවතුම් යහපත් තත්ත්වයෙන් නොපවතිත බැවින්, නිසි ප්‍රමිතියෙන් යුතු වෑන් රථ සේවාවක් පවත්වාගෙන යෑම සඳහාත්, එම සේවාවන් ලබාගන්නා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහාත්, වෑන් රථ සේවාවන් සඳහා ප්‍රමිතීන් හඳුන්වාදිය යුතුයැයි ද, වෑන් රථ සේවකයින් තුළ යහපත් පැවතුම් පවත්වාගෙන යාම සඳහා විනය නීති මාලාවක් හඳුන්වා දිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.37/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික සහ ජාත්‍යන්තර අනාගත ඉල්ලුමට සරිලන ලෙස නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම,— ජාතික සහ ජාත්‍යන්තර ප්‍රජාවගේ අනාගත ඉල්ලුමට සරිලන කාර්මික සහ කෘෂිකාර්මික නිෂ්පාදනයන් පිළිබඳව පුරෝකථනයක් කර අදාළ නිෂ්පාදනයන්ට අනුබද්ධිත සියලුම ක්ෂේත්‍රවල අන්තර් සම්බන්ධතාවයක් තුළින් ද, නවීන තාක්ෂණය උපරිම මට්ටමින් ප්‍රයෝජනයට ගනිමින් ද, නිෂ්පාදන ක්‍රියාවලිය වර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.38/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික උරුමයන් රැකගැනීම සඳහා ඩිජිටල් පුස්තකාලයක් ඇති කිරීම,— ශ්‍රී ලාංකික ජනතාවගේ සම්ප්‍රදායික දැනුම ආරක්ෂා කරමින්, පෝෂණය කර අනාගත පරම්පරාව වෙත රැගෙන යාම සඳහා ද, ජාන සම්පත් හා ජෛව උරුමයන් අපහරණය වැළැක්වීම සඳහා පුළුල් ජාතික වැඩපිළිවෙළක් අවශ්‍යව ඇති බැවින් ද, පරිසරය, දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය, කෘෂිකර්මාන්තය හා සම්ප්‍රදායික කර්මාන්ත ඇතුළු සියලු ක්ෂේත්‍රයන් සඳහා ඩිජිටල් තාක්ෂණය උපයෝගී කරගත් නවීන පුස්තකාලයක් සකස් කිරීමට ද, ඒ සඳහා ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO), ශ්‍රී ලංකා බුද්ධිමය දේපළ කාර්යාංශය, පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ඒකකය ඇතුළු සියලු අංශ ඒකාබද්ධවූ වැඩපිළිවෙළක් සකස් කිරීමට ද පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.39/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික දැනුම ආරක්ෂා කර ගැනීම සඳහා වූ ජාතික වැඩපිළිවෙළක් ආරම්භ කිරීම,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික දැනුම භාවිතා වන වෛද්‍ය ක්‍රම, කෘෂිකර්මාන්තය, ආහාර සංරක්ෂණය, හස්ත කර්මාන්ත අංශය ඇතුළු විවිධ ක්ෂේත්‍රයන්හි පාරම්පරික දැනුම ආරක්ෂා කිරීම සඳහා අදාළ ක්ෂේත්‍රයන් නියෝජනය කෙරෙන ජනතාවගෙන් තොරතුරු ලබාගෙන, ජෛව විවිධත්ව ඒකකය, බුද්ධිමය දේපළ කාර්යාංශය ඇතුළු අදාළ අංශ ඒකාබද්ධව ජාතික වැඩපිළිවෙළක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.40/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවට ආවේණික හා ඖෂධමය වටිනාකම්වලින් යුතු ශාකවල ජාන සම්පත්වලට පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම,— විදේශීය රටවල් ශ්‍රී ලංකාවට ආවේණික වටිනා ඖෂධමය ශාකවල සක්‍රිය රසායනික ද්‍රව්‍ය සහ ජාන සම්පත් හඳුනා ගෙන, ඒවාට වංචනික ලෙස පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම වැළැක්වීම සඳහා අදාළ සක්‍රිය රසායනික ද්‍රව්‍ය සහ ජාන සම්පත් සඳහා ශ්‍රී ලංකාවට පේටන්ට් බලපත්‍ර ලබා ගැනීමටත්, ඖෂධ නිෂ්පාදනයට සහ වැඩි දියුණු කිරීමට එම කොටස් යොදා ගැනීමටත්, ජෛව විවිධත්ව අංශය, බුද්ධිමය දේපළ කාර්යාංශය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ඇතුළු වගකිවයුතු සියලු ආයතන එක්ව විශේෂ වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.41/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජනතා නියෝජිතයින්ගේ ගරු නාම අත්හැරීම,— ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු පාර්ලිමේන්තු, පළාත් සභා, ප්‍රාදේශීය සභා නියෝජනය කරන සියලුම ජනතා නියෝජිතයන් මාසිකව තමන් කරන සේවයට අදාළව වැටුප් හා / හෝ දීමනා ලබා ගන්නා අතර ඉහත කිසිදු ධූරයක් නිස්සරණධ්‍යාසයෙන් සිදු කරනු ලබන ගරු සේවයන් නොවන බැවින් ද, එම ධූර දරන්නන්ගේ නමට ඉදිරියෙන් හෝ ධූරයට ඉදිරියෙන් අතිගරු, ශ්‍රීමත් හෝ ගරු යන නාම සහ නමට පසුව උතුමාණන්, මැතිතුමා යන පද යෙදීම උපහාසයට ලක්වීමට හේතුවක් වී ඇති බැවින් ද, ජනතා නියෝජිතයන්ගේ ගරු නාම භාවිතය නතර කිරීමට අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.42/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩසටහන පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කිරීම,— විවිධ පාර්ශ්වයන් විසින් වැඩිහිටි පුරවැසියන් නොසලකා හැරීම තුළින් සිදුවන විවිධ අසාධාරණයන් සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා සමාජ සේවා අමාත්‍යාංශයේ වැඩිහිටි ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩසටහන පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.43/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි ප්‍රජාව ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට දායක කර ගැනීමට ණය දීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති වැඩිහිටි ප්‍රජාවට තම ජීවනෝපාය මාර්ග ශක්තිමත් කරගනිමින් සමස්ත ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනයට දායකවීමට බැංකු පද්ධතිය මගින් ණය දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවීම ඔවුන්ට සමාජය තුළ වෙනත් අකාරයකට සැලකීමක් වන හෙයින් එම අසාධාරණ තත්ත්වය වැළැක්වීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.44/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති පුද්ගලයින් සමාජය තුළ සක්‍රිය පුද්ගලයින් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම,— සමාජ ආර්ථික ක්‍රියාවලියේ ප්‍රගමනය උදෙසා තම ශ්‍රමය කැප කර වයස අවුරුදු 60 ඉක්මවීමෙන් පසු සමාජය තුළ නිසි පිළිගැනීමක් නොමැතිව අක්‍රියව කොන්වී සිටින වැඩිහිටියන්, සමාජයේ සක්‍රිය පුද්ගලයින් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීමට පාසල් ප්‍රජාව ඇතුළු මුළු මහත් සමාජයම දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.45/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ පාසල් සිසුන්ගේ දැනුම පුළුල් කිරීම,— ශ්‍රී ලංකාවේ අනාගත තරුණ තරුණියන්ගේ රැකියා ප්‍රශ්නයට විසඳුමක් ලෙස සහ මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ ඇතිවන්නාවූ වර්ධනයට සාපේක්ෂව පුහුණු ශ්‍රමිකයින්ගේ අවශ්‍යතාව සපුරා ගැනීමේ අරමුණ ඇතිව පාසල් විෂය නිර්දේශයට මෝටර් කාර්මික ශිල්පය විෂයයක් ලෙස ඇතුළත් කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.46/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ශිල්පය ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමට අධ්‍යාපන විද්‍යා පීඨයක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ සහ විදේශ රටවල මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ ඇතිවන වර්ධනයට සරිලන ලෙස, එම ක්ෂේත්‍රයේ පුහුණු ශ්‍රමිකයින්ගේ ඉල්ලුම සපුරාලීමට හැකිවන පරිදි, පාසල් මට්ටමින් ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමට මෝටර් කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ අධ්‍යාපන විද්‍යා පීඨයක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.47/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ශිල්පය විෂය නිර්දේශයන් යාවත්කාලීන කිරීම,— මෝටර් කාර්මික ක්ෂේත්‍රය හා සම්බන්ධ රජයේ කාර්මික විද්‍යාල හා අනුබද්ධ ආයතනවල ඉගෙනුම් කටයුතු සිදු කරනු ලබන්නේ වසර 25 - 30ක් තරම් පැරණි විෂය නිර්දේශයක් යටතේ බැවින්, එම තත්ත්වය වෙනස් කිරීම සඳහා එම විෂය නිර්දේශයන් යාවත්කාලීන කිරීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.48/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ත්‍රිරෝද රථ හා යතුරු පැදි ආශ්‍රිත රැකියාවල නියුක්ත වූවන්ගේ රැකියාවල සුරක්ෂිතභාවය තහවුරු කිරීම,— ශ්‍රී ලංකාව තුළ ජීවත්වන ත්‍රිරෝද රථ හා යතුරුපැදි ආශ්‍රිතව ඍජු හා වක්‍ර ලෙස රැකියාවන්හි නියුක්තවීමට කැමැත්තක් දක්වන තරුණ පිරිස හා විශ්‍රාමික ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් යන ජන කණ්ඩායම්වල ආර්ථික ශක්තිය වර්ධනය කිරීමෙන් සමස්ත ජාතික නිෂ්පාදිතයට ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීමේ අරමුණ ඇතිව එම ක්ෂේත්‍රයේ නියුක්තවූවන්ගේ සක්‍රීය දායකත්වය ජාතික ආර්ථිකයට එක් කර ගැනීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් කඩිනමින් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.49/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකීය/දේශීය සූපවේදය පිළිබඳ රට තුළ ජනතා ආකල්ප පුළුල් කිරීම,— ශ්‍රී ලාංකීය/දේශීය ආහාර කලාව පිළිබඳ දේශීය හා විදේශීය ජනතාව තුළ වැඩි නැඹුරුවක් ඇති කිරීමේ අරමුණ ඇතිව, රට තුළ ජනතා ආකල්ප ඒ වෙත යොමු කිරීම සඳහා පාසල්, විශ්වවිද්‍යාල, තෘතීයික අධ්‍යාපන ආයතනවල විෂය පාඨමාලාවට සූපවේදය විෂයයක් ලෙස ඇතුළත් කිරීමටත්, රාජ්‍ය හා පෞද්ගලික අංශවල මැදිහත්වීම මත පර්යේෂණ අංශ දිරිගැන්වීම මගින් නව සොයාගැනීම් සිදු කිරීමටත්, ඒ හා බැඳුනු ආයතන පද්ධතිය සම්බන්ධ කර ගනිමින් සහතික පත්‍ර, ඩිප්ලෝමා, උපාධි, පශ්චාත් උපාධි පාඨමාලා ඇති කිරීම තුළින් මෙම ක්ෂේත්‍රය පිළිබඳ ජනතාව තුළ පුළුල් ආකල්පමය වෙනසක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.50/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ ආහාර සංස්කෘතිය ඉගෙනුම් සහ ඉගැන්වීමේ ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලාංකීය ආහාර කලාව, රස කාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංශ ගණනාවකින් සකස්වී ඇති අතර ඒ හා බැඳුණු ශ්‍රී ලාංකීය ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මෙන්ම දේශීය හා විදේශීය ජනතාව අතර අපගේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීම මගින් ශ්‍රී ලාංකීය අනන්‍යතාව අන්තර්ජාතිකව ඔසවා තැබීම සඳහා වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.51/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල සහ තෘතීයික අධ්‍යාපන ආයතනවල සිසුන්ගේ පර්යේෂණ නිබන්ධන අමාත්‍යාංශවල සංවර්ධන කටයුතු ඉලක්ක කර සකස් කිරීම,— විශ්වවිද්‍යාල සහ තෘතීයික අධ්‍යාපන ආයතනවල සිසුන් විසින් තම පාඨමාලා සම්බන්ධයෙන් ඉදිරිපත් කරන පර්යේෂණ නිබන්ධන රටේ ආර්ථික, සමාජීය, සංස්කෘතික හා සංවර්ධන කටයුතුවලට උපයෝගී කර ගැනීම වැදගත් වන බැවින් එම නිබන්ධන අධීක්ෂණය කරනු ලබන ආචාර්යවරු හා පර්යේෂණ නිබන්ධන අදාළ වන අමාත්‍යාංශ අතර මනා සම්බන්ධීකරණයක් ඇති කිරීම සඳහා එකී අමාත්‍යාංශයේ නිලධාරියෙකු පත්කිරීමෙන් එම පර්යේෂණ නිබන්ධන මගින් අමාත්‍යාංශයේ ඉදිරි සංවර්ධන ක්‍රියාදාමයන් සහ කාලීන ඉලක්ක සපුරා ගැනීමට හැකිවන පරිදි ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.52/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වයස අවුරුදු 18 සම්පූර්ණ වන අවස්ථාවේදීම ඡන්ද හිමි නාමලේඛනයට නම ඇතුළත් කිරීම,— මැතිවරණ දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව ඡන්ද හිමි නාමලේඛන සංශෝධනය කිරීමට නියමිත දිනට පසුව හෝ පෙර දිනකදී වයස අවුරුදු 18 සම්පූර්ණ වන තැනැත්තන්ට නියමිත වයස සම්පූර්ණ වූ දිනටම ඡන්ද හිමි නාමලේඛනයෙහි නම ඇතුළත් කරවා ගත හැකි ආකාරයේ ප්‍රායෝගික වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.53/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ සේලයින් නිෂ්පාදනය කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කිරීම,— ශ්‍රී ලංකාව තුළ වාර්ෂිකව සේලයින් විශාල ප්‍රමාණයක් භාවිතා කරනු ලබන අතර සේලයින් ආනයනය කිරීම සඳහා ද විශාල මුදලක් වාර්ෂිකව විදේශීය රටවලට ඇදී යන බැවින්, එම විදේශ විනිමය ප්‍රමාණය රට තුළ ඉතිරි කර ගැනීමේ අරමුණ ඇතිව ලංකාව තුළ පවත්නා දේශීය තාක්ෂණය යොදාගෙන සේලයින් නිෂ්පාදනය කිරීම සඳහා රාජ්‍ය, පෞද්ගලික හෝ සමුපකාර අංශයන් සම්බන්ධ කර ගනිමින් ක්‍රමවත් වැඩපිළිවෙළක් රජය මැදිහත් වීමෙන් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.54/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පොල් වතුර ආශ්‍රිතව නව නිෂ්පාදනයන් ඇති කිරීම,— ශ්‍රී ලංකාව තුළ වාර්ෂිකව විශාල ප්‍රමාණයක පොල් වතුර අපතේ යන බැවින්, නව තාක්ෂණය යොදා ගනිමින් විධිමත් ක්‍රමවේදයක් යටතේ පොල් වතුර ආශ්‍රිතව නව නිෂ්පාදනයන් දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.55/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සාගරයේ නව සම්පත් ගවේෂණය,— විශාල සාගර කලාපයක් හිමි රටක් වූ ශ්‍රී ලංකාව ප්‍රමුඛත්වය ලබා දී ඇත්තේ ධීවර කර්මාන්තය සඳහා පමණක් වන අතර සාගරය ආශ්‍රිතව විශාල ප්‍රමාණයක සවභාවික සම්පත් ඇති බැවින් මෙරටට විශාල රැකියා අවස්ථා ප්‍රමාණයක් මෙන්ම ධනයක් ද උපයා ගැනීමේ අරමුණ ඇතිව සාගර සම්පත් පිළිබඳව විධිමත් වැඩිදුර අධ්‍යයනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.56/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ මත්ස්‍ය සම්පත විදේශිකයින් විසින් නෙලා ගැනීම වළකාලීම,— ශ්‍රී ලාංකික ධීවරයන්ට විශාල ආර්ථික අවාසියක් ඇති කරමින් ශ්‍රී ලංකා මුහුදු කලාපයේ මත්ස්‍ය සම්පත් විදේශිකයින් විසින් නෙලා ගන්නා බැවින් ශ්‍රී ලංකා මුහුදු කලාපය තුළ මාළු ඇල්ලීමට සහ විදේශ යාත්‍රාවලට මාළු බෑම සඳහා තොටුපලක් ලෙස භාවිතා කිරීම වළකාලීම සඳහා රජය විසින් විධිමත් වැඩ පිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.57/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කොස් නිෂ්පාදනය වැඩි කර ඒ ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීම,— ඉතා ප්‍රනීත මෙන්ම ඖෂධීය ගුණයෙන් අනූන, රසායනික ද්‍රව්‍යවලින් තොරව වගා කළ හැකි බෝගයක් වන කොස් වගාව ව්‍යාප්ත කිරීම තුළින් ඒ ආශ්‍රිත නිෂ්පාදන ඉහළ නංවා ඒවා අපනයනය කිරීම මගින් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් අප රටට උපයා ගත හැකි බැවින් ඒ සඳහා රජයේ මැදිහත්වීමෙන් විධිමත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.58/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ගොවි සම්මාන උළෙලක් වාර්ෂිකව සංවිධානය කිරීම,— රටක් පෙරට යාමට නම් මූලික වශයෙන් ගොවිතැනින් සශ්‍රීක විය යුතු බැවින් රට සරු කරන ගොවි ජනතාවට සිය වෘත්තිය පිළිබඳ අභිමානයක් ඇතිවන පරිදි විධිමත් සංවිධාන ව්‍යුහයක් හරහා ක්‍රියාත්මක වන ගොවි සම්මාන උළෙලක් රජයේ මැදිහත්වීමෙන් වාර්ෂිකව සංවිධානය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.59/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සහන මිලකට LED බල්බ පාරිභෝගික ජනතාවට ලබාදීම,— නිවාස ආලෝක කිරීමට යොදා ගන්නා ගුණාත්මක LED බල්බ මිල අධික බැවින්, විදුලිබල මණ්ඩලය මැදිහත්වී සහනදායි මිලකට හා ගෙවීමේ ක්‍රමයට මෙම බල්බ පාරිභෝගික ජනතාවට ලබාදී ජාතික වශයෙන් විදුලිය විශාල ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමටත්, LED බල්බ ජනතාව අතර ජනප්‍රිය කිරීම මගින් විදුලිබල මණ්ඩලයටද අමතර ආදායමක් උපයා ගැනීමටත් හැකිවන පරිදි ක්‍රමවත් වැඩ පිළිවෙළක් සැකසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.60/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සුළු පරිමාණ සෙල්ලම් බඩු කර්මාන්තශාලා ව්‍යාප්ත කිරීම,— ශ්‍රී ලංකාව තුළ සෙල්ලම් බඩු සඳහා විශාල වෙළඳපොළක් පැවතුණ ද, රට තුළ ඒවා නිෂ්පාදනය කෙරෙන්නේ සුළු වශයෙන් වන අතර ඒ සඳහා චීනය ප්‍රමුඛ අනෙකුත් රටවලට විදේශ විනිමය විශාල ප්‍රමාණයක් ඇදී යන බැවින්, සුළු පිරිවැයක් දැරිය යුතු මෙම කර්මාන්තය ග්‍රාමීය ප්‍රදේශවල ව්‍යාප්ත කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.61/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ ඖෂධ නිෂ්පාදන කර්මාන්ත ශාලා ආරම්භ කිරීම,— ශ්‍රී ලංකාව තුළ ඖෂධ නිෂ්පාදනය දැනට ඉතා අවම මට්ටමක පවතින අතර ඖෂධ ආනයනය සඳහා වසරකට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වැයවන බැවින් දියුණු මානව සම්පතක් හිමි රටක් ලෙස ශ්‍රී ලංකාවට අත්‍යාවශ්‍ය ඖෂධ වර්ග රට තුළම නිපදවීමට අවශ්‍ය පහසුකම් රජය මැදිහත් වීමෙන් ලබා දී ඖෂධ නිෂ්පාදන කර්මාන්ත ශාලා ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.62/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් විෂය නිර්දේශයට මනෝ විද්‍යාව විෂයය ඇතුළත් කිරීම,— පාසල් ශිෂ්‍ය ප්‍රජාව නිරෝගී මනසකින් යුත් බුද්ධිමත් තීරණ ගැනීමට හැකි පිරිසක් ලෙස හැඩගැස්වීම උදෙසා හය වැනි ශ්‍රේණියේ සිට ක්‍රියාත්මක වන පරිදි බෞද්ධ මනෝ විද්‍යාව සහ බටහිර මනෝ විද්‍යාව යන විෂයයන් ඒකාබද්ධ කොට ක්‍රමවත්ව සැලසුම් කරන ලද "මනෝ විද්‍යාව සහ භාවනාව" නමින් විෂයයක් පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.63/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්‍රාමික ආධාරක මධ්‍යස්ථාන පිහිටුවීම,— විශ්‍රාමිකයන් වෙනුවෙන් උපදේශන සේවා, වෛද්‍ය පහසුකම් සහ දිවා සුරැකුම් සේවා යනාදී වැඩිහිටියන්ට අවශ්‍ය සුබසාධන කටයුතු රැසක් එකම ස්ථානයකින් ඉටු කර ගැනීමට හැකි වන පරිදි විශ්‍රාමික ආධාරක මධ්‍යස්ථාන ගොඩනැංවීමටත්, එම මධ්‍යස්ථාන කේන්ද්‍ර කර ගනිමින් යම් නිෂ්පාදන කටයුත්තක් සඳහා විශ්‍රාමිකයන් යොමු කිරීම හරහා ඔවුන්ගේ දිවියට සහනයක් ලබාදෙන අතර අමතර ආදායමක් ද උපයා ගැනීමට හැකි වන ලෙස රජය මැදිහත් වීමෙන් රටපුරා විශ්‍රාමික ආධාරක මධ්‍යස්ථාන පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.64/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්‍රාමිකයන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා නව ලොතරැයියක් හඳුන්වා දීම,— විශ්‍රාමික රාජ්‍ය සේවකයන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීමට සහ ඔවුන්ගේ සුබසාධන කටයුතු සඳහා අවශ්‍ය මුදල් සොයා ගැනීම සඳහා නව ලොතරැයියක් වෙළඳපොළට හඳුන්වාදීමට රජය කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.65/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක මගපෙන්වන්නන් පුහුණු කිරීම,— සංචාරකයින්ට ඵලදායී හා ආචාරශීලී සේවාවක් සැපයීමට හැකි පිරිසක් බවට පත් කිරීමට මෙන්ම, ඔවුන්ගේ වෘත්තීය මට්ටම ඉහළ නැංවීම සඳහාත් සංචාරක මගපෙන්වන්නන් පුහුණු කිරීමට විධිමත් වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.66/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉඩම් සම්බන්ධව පවතින නීති සංශෝධනය කිරීම,— ශ්‍රී ලංකාව තුළ මේ වන විට ඉඩම්වලට ව්‍යාජ ඔප්පු සකසා විකිණීමේ ජාවාරමක් ක්‍රියාත්මකවන අතර මීට අදාළව නීතිය ක්‍රියාත්මක වීම ද ඉතා අවම මට්ටමක පවතින බැවින්, ඉඩම් අයිතිය සම්බන්ධව සුරක්ෂිතභාවය වැඩි වන අයුරින් හා වැරදිකරුවන්ට දැඩි දඬුවම් පැමිණවිය හැකි අයුරින් පවතින නීති පද්ධතිය සංශෝධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.67/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව අවට සාගරයේ කොරල්පර ආරක්ෂා කර ගැනීම,— ශ්‍රී ලංකාව අවට සාගරයේ ඇති කොරල්පර මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් විනාශවීමේ තර්ජනයට මුහුණපා ඇති බැවින්, එම කොරල්පර ආරක්ෂාකර ගැනීම සඳහා මිනිස් ක්‍රියාකාරකම් පාලනය කිරීමට හැකිවන පරිදි පුද්ගල ආකල්පමය වෙනසක් මෙන්ම, නෛතික රාමුවේ වෙනසක් ඇති කිරීම සඳහා විද්වත් කමිටුවක් හරහා සුදුසු වැඩපිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.68/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් වෑන් රථ සඳහා කාන්තාවන් සේවයට යෙදවීම,— පාසල් වෑන් රථ සේවයෙහි ගුණාත්මක බව වැඩි කිරීමටත්, එම වෑන් රථවල ගමන් කරන දරුවන්ගේ ආරක්ෂාව උදෙසාත් සියලුම පාසල් සේවා වෑන් රථවල සේවය සඳහා කාන්තාවන් යොදා ගැනීම අනිවාර්ය කිරීමට නීති සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.69/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඖෂධ මිල පහත හෙලීම,— ශ්‍රී ලංකාව තුළ ජාතික ඖෂධ ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කර ඖෂධීය නාමයෙන් බෙහෙත් අලෙවි කිරීම කඩිනමින් ආරම්භ කිරීම මගින් ඖෂධ මිල පහත හෙලීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.70/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අන්තර්ජාලය හරහා අලෙවි කරන ඖෂධ ඇතුළු ජාවාරම් මැඩපැවැත්වීම,— මේ වන විට අන්තර්ජාලය හරහා ප්‍රමිතියකින් තොර ඖෂධ, වෛද්‍ය උපකරණ හා රූපලාවන්‍ය නිෂ්පාදන විශාල ලෙස අලෙවි කෙරෙන අතර මෙම ජාවාරම් අප රටේ ජනතාවගේ සෞඛ්‍යයට සහ යහපැවැත්මට විශාල තර්ජනයක් වන බැවින් ඒවා මැඩපැවැත්වීම සඳහා නිසි වැඩපිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.71/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතා නොකර වගා කිරීම,— අධික විෂ සහිත කෘෂි රසායන ද්‍රව්‍ය ශ්‍රී ලංකාව තුළ තහනම් කර පැරණි ක්‍රමයට පරිසර හිතකාමී වගා ක්‍රමයක් රටට හඳුන්වාදීමට අවශ්‍ය පර්යේෂණ සිදුකිරීමට කෘෂි විද්‍යාඥයන් හා පරිසරවේදීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කර ඔවුන්ගෙන් ලබා ගන්නා නිර්දේශ තුළින් ජනතාවට වස විසෙන් තොර සෞඛ්‍යාරක්ෂිත ආහාර වේලක් ලබා දීමට අවශ්‍ය පියවර ගැනීමට රජය මැදිහත්වීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.72/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීමෙන් මුදවා ගැනීම,— මේ වන විට ශ්‍රී ලංකාව තුළ පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමේ වැඩි ප්‍රවණතාවයක් නිර්මාණය වී ඇති බැවින් පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලින් මුදවාගැනීම සඳහා රජය මැදිහත්වී විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.73/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඵලදායීතා කමිටුවක් පත් කිරීම,— රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන ඵලදායීතා වැඩසටහන්හිදී තම ආයතන ඉතා ඉහළ ඵලදායීතා මට්ටමක් කරා මෙහෙයවූ ආයතන ප්‍රධානීන් හඳුනාගෙන ඔවුන්ගේ දැනුම හා අත්දැකීම් ප්‍රයෝජනයට ගත හැකි වන ආකාරයෙන්, එම ආයතනවල ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ ක්‍රමවේද අනෙකුත් ආයතනවලට ගැලපෙන පරිදි ආදේශ කිරීමට හැකිවන පරිදි එම ආයතන ප්‍රධානීන්ගෙන් සමන්විත ජාතික ඵලදායීතා කමිටුවක් පිහිටවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.74/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රජා වෛද්‍යවේදය පිළිබඳ විශේෂඥ සේවාව දියුණු කිරීම,— සෞඛ්‍ය සේවාවේ අත්‍යාවශ්‍ය අංගයක් වන ප්‍රජා වෛද්‍යවේදය පිළිබඳ විශේෂඥ අංශය දියුණු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම හා එම ක්ෂේත්‍රයේ දැනට පවතින ගැටලු නිරීක්ෂණය කර කඩිනමින් නිරාකරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.75/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉංග්‍රීසීන් රාජද්‍රෝහීන් ලෙස නම් කළ ශ්‍රී ලාංකිකයින් ජාතික වීරයන් ලෙස නම් කිරීම,— වර්ෂ 1815 සිට 1948 නිදහස ලැබීම දක්වා වූ කාලය තුළ ඉංග්‍රීසීන්ට එරෙහිව රට ජාතිය වෙනුවෙන් දිවි නොතකා සටන් කළ ශ්‍රී ලාංකිකයින් රාජ ද්‍රෝහීන් ලෙස නම් කර ඇති අතර ඔවුන් සියලුදෙනාම විශේෂ ගැසට් පත්‍රයක් මගින් ජාතික වීරයන් ලෙස නම් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.76/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිභෝජනයට නුසුදුසු ආහාර වෙළඳ පොළට ඒම වැළැක්වීමට කටයුතු කිරීම,— පරිභෝජනයට නුසුදුසු ආහාර නිෂ්පාදනය කරන, අලෙවි කරන හා ඊට අනුබල දෙන පුද්ගලයන් හා ආයතන වැටලීමට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ විශේෂ වැටලීම් ඒකකයට පවතින ගැටලු නිරාකරණය කර අවශ්‍ය පහසුකම් නොඅඩුව ලබා දීමටත්, වැරදිකරුවන්ට උපරිම දඬුවම් ලබා දිය හැකි වන පරිදි පවතින නීති පද්ධතිය සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.77/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වස විස නැති ආහාර නිෂ්පාදනය දිරිමත් කිරීම,— ආහාර හා සම්බන්ධ නිෂ්පාදන කටයුතුවල දේශීයව නිරතව සිටින නිෂ්පාදකයින් ඉලක්ක කර ගනිමින් ගුණාත්මක බවින් ඉහළ, සෞඛ්‍යාරක්ෂිත ආහාර පාරිභෝගිකයන්ට ලබා දීම තුළින් රටට කළ හැකි සේවාව පිළිබඳව දැනුවත් කර, ආකල්පමය වෙනසක් ඇති කිරීමට හා එලෙස වස විසෙන් තොර ආහාර නිපදවන ව්‍යවසායකයින්ට ගෞරව නාමයක් සහිත සම්මාන ප්‍රදානය කොට ඔවුන් දිරිගැන්වීමට වැඩසටහනක් රජය මැදිහත්වී ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.78/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අයථා ලෙස අත්පත් කරගත් අභයභූමිවලට අයත් ඉඩම් නිදහස් කරගැනීම,— ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කර ඇති අභයභූමිවලට අයත් ඉඩම් විවිධ පුද්ගලයින් හා සංවිධාන විසින් නීති විරෝධී ලෙස අත්පත් කරගෙන ඇති බැවින්, එම ඉඩම් නැවත ලබා ගැනීමට රජය කඩිනමින් මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.79/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ආදිවාසී ජනයා නගාසිටුවීම සඳහා සැලසුමක් ක්‍රියාත්මක කිරීම,— ශ්‍රී ලංකාව තුළ දැනට වාසය කරන ආදිවාසී ජනතාව පිළිබඳ වෙනම සංගණනයක් සිදුකර, ඔවුනට ජීවත් වීම සඳහා දැනට පවතින අපහසුතා ක්‍රමවත්ව හඳුනාගෙන, ඔවුනට ගෞරවනීයව ජීවත් වීමට හැකි පරිසරයක් නිර්මාණය කර දීමට අවශ්‍ය සාධනීය සැලසුමක් ආදිවාසී නායකයින් ද ඇතුළත්ව පත්කරන ලද විද්වත් මණ්ඩලයක් හරහා ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.80/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— යුද්ධය නිසා උතුරු හා නැගෙනහිර ප්‍රදේශයන්හි හානි වූ පුරාවස්තු සංරක්ෂණය කිරීම,— තිස් වසරක යුද්ධය හේතුවෙන් උතුරු හා නැගෙනහිර පළාත් වල පැවති පුරාවස්තු විශාල ලෙස විනාශ වූ අතර පවතින පුරාවස්තු පිළිබඳ සමීක්ෂණයක් සිදු කර තොරතුරු රැස්කර ගැනීමත්, එම පුරාවස්තු තහවුරු කිරීම, ආරක්ෂා කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීමත් අරමුණු කර ගෙන විද්වත් පුරාවිද්‍යාඥයින්ගෙන් සමන්විත කමිටුවක් පත්කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.81/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වගා කිරීම සඳහා දේශීය බීජ ප්‍රචලිත කිරීම,— කෘෂි රසායන භාවිතයෙන් තොරව දේශීය කාබනික පොහොර ආශ්‍රයෙන් වගා කළ හැකි දේශීය බීජ වර්ග හඳුනාගෙන එම බීජ කඩිනමින් රට පුරා ව්‍යාප්ත කර රසායනික වස විසෙන් තොර ආහාර ජනතාවට ලබා දීම සඳහා අවශ්‍ය කරන පර්යේෂණ, තාක්ෂණය හා නිෂ්පාදනය වැඩි දියුණු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.82/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ භාෂා අධ්‍යයනයට පහසුකම් සැපයීම,— පුද්ගල බුද්ධියේ පෘථුල බව තීරණය වීමට ඔහු සතු භාෂා ඥානය ප්‍රධාන සාධකයක් වන බැවින් ඉංග්‍රීසි භාෂාව හැරුණුකොට අනෙකුත් ප්‍රධාන විදේශ භාෂා හැදෑරීමට අවශ්‍ය පහසුකම් පුළුල් කර, සැලසුම් සම්පාදනය කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.83/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා වියදම් කරන මුදල් සීමා කිරීම,— ශ්‍රී ලංකාව තුළ පැවැත්වෙන සියලු මැතිවරණයන්හිදී ඇතැම් අපේක්ෂකයන් අති විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කරන අතර මුදල් වියදම් කළ නොහැකි, එහෙත් රටට වැඩක් කළ හැකි බුද්ධිමත් පිරිසකට ඉන් අවාසි සහගත තත්ත්වයක් ඇති වන බැවින් මැතිවරණ සඳහා වියදම් කරන මුදල් ප්‍රමාණය සීමා කිරීමට හැකි වන ආකාරයේ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.84/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— යටත් විජිත සමයේ ශ්‍රී ලංකාවෙන් රැගෙන ගිය පුරාවස්තු නැවත ලබා ගැනීම,— ශ්‍රී ලංකාව යටත් විජිතයක්ව පැවති සමයේ අප රටින් පෘතුගාලය, ඕලන්දය හා මහා බ්‍රිතාන්‍යයට රැගෙන ගිය පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත භාණ්ඩ පිළිබඳ සමීක්ෂණයක් සිදු කර එම භාණ්ඩ නැවත අප රටට ලබා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.85/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සංඝාධිකරණයක් ස්ථාපනය කිරීම,— භික්ෂූන් වහන්සේලාගේ ආරක්ෂාව හා ගෞරවය රැක ගැනීම වෙනුවෙන් උන්වහන්සේලාට අදාළ අධිකරණමය කාර්යයන් සඳහා වෙනම සංඝාධිකරණයක් පිහිටුවිය යුතු බවටත් එම අධිකරණ තීන්දු සඳහා නීතිමය බලය ලබාගැනීමට හැකි වන අයුරින් මෙම සංඝාධිකරණය ස්ථාපනය කළ යුතු බවටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.86/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ව්‍යවස්ථාපිත සංඝ සභාවක් පත් කිරීම,— පාර්ලිමේන්තුව ඇතුළු ජනතා නියෝජිත ආයතන සඳහා උපදේශකත්වය හා මග පෙන්වීම ලබා දීමට හා අණපනත්වලට සංශෝධන ඉදිරිපත් කළ හැකි නෛතික බලය සහිත සංඝ සම්මුතියෙන් පත් කර ගත් රාජ්‍ය පරිපාලනය, නීතිය, විදේශ කටයුතු හා සමාජ ක්‍රියාකාරකම් පිළිබඳ හසල දැනුමක් සහ අත්දැකීම් සහිත විද්වත් සංඝයා වහන්සේලාගෙන් සමන්විත ව්‍යවස්ථාපිත සංඝ සභාවක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.87/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වාපි සංස්කෘතික අධ්‍යයන ආයතනයක් පිහිටුවීම,— ශ්‍රී ලංකාවේ පැවැති ජල තාක්ෂණය හා වැව් තාක්ෂණය නැවත පණගන්වා රැකගැනීම සහ වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ සිදු කිරීමට හා අධ්‍යාපන පාඨමාලා මගින් උක්ත විෂය ගැන දැනුමින් සන්නද්ධ කරන ලද පිරිසක් නිර්මාණය කිරීමට හැකියාව ඇතිවන පරිදි "වාපි සංස්කෘතික අධ්‍යයන ආයතනය" නමින් ආයතනයක් රජය මැදිහත්වීමෙන් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.88/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මහාවංශය අධ්‍යයනය සඳහා ආයතනයක් පිහිටුවීම,— ශ්‍රී ලාංකීය ඉතිහාසයේ ගමන් මග පෙන්වන මහාවංශය අධ්‍යයනය කිරීම සඳහා භික්ෂූන් වහන්සේලාගේ මැදිහත් වීමෙන් "මහාවංශ අධ්‍යයන පර්යේෂණ ජාතික ආයතනය" නමින් ආයතනයක් රාජ්‍ය අනුග්‍රහයෙන් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.89/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ විරෝධී ක්‍රියා නැවැත්වීම,— ධර්ම ග්‍රන්ථ හා ප්‍රකාශන අධ්‍යයනය කිරීමේ මනා දැනුමක් ඇති නෛතික බලයක් සහිත විද්වත් සංඝ මණ්ඩලයක් පිහිටුවීම මගින් යම් නිර්මාණයක් එළිදැක්වීමට පෙර එය එම මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, සමාජගත කිරීමට නුසුදුසු නම්, සංශෝධන ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි යාන්ත්‍රණයක් සැකසීම මගින් බෞද්ධ විරෝධී ක්‍රියා හා ප්‍රකාශන රචනා වීම හා බුදු දහම සම්බන්ධ කරමින් සාවද්‍ය නිර්වචන ඉස්මතුවීම නැවැත්වීම සඳහා රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.90/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශ හිතෛෂී කලා නිර්මාණ ඇගයීම,— දේශානුරාගය හා ආත්මාභිමානය ඇතිවන පරිදි දේශීය හා සංස්කෘතික වටිනාකමින් අනූන කලාකෘති වාර්ෂිකව ඇගයීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.91/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ විනය නැංවීමට කටයුතු කිරීම,— ශ්‍රී ලංකාවේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සෞඛ්‍ය සම්පන්න, නිරෝගී හා කායිකව ශක්තිමත් පුරවැසියන් ලෙස සමාජගත කිරීමේ අරමුණින් ඔවුන්ට තමා කැමති ක්‍රීඩාවකට යොමු වීමට සහ ප්‍රායෝගික විනය පුහුණුවකට යොමු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.92/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ සංස්කෘතික තොරතුරු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම,— ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති බෞද්ධාගමික ස්ථාන, ඒ හා සබැඳි අනුෂංගික අංශයන් මෙන්ම, භික්ෂූන් වහන්සේලා පිළිබඳ තොරතුරු ආදී කරුණු එක් රැස් කර විධිමත්ව පරිගණක ගත කර, නවීන තාක්ෂණික උපකරණ සහ ප්‍රමාණවත් මානව හා භෞතික සම්පත් වලින් පිරිපුන් "බෞද්ධ සංස්කෘතික තොරතුරු මධ්‍යස්ථානය" නමින් ආයතනයක් රාජ්‍ය අනුග්‍රහයෙන් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.93/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— දහම් පාසල් පාඨ ග්‍රන්ථ කාලානුරූපීව සංශෝධනය කිරීම,— විභාග ඉලක්ක කරගත්, දැනුම පමණක් කේන්ද්‍රගත කළ පාඨ ග්‍රන්ථ වෙනුවට ප්‍රායෝගික පුහුණුව පදනම් කරගත්, බුද්ධිය වර්ධනය කරන්නාවූ, ශිෂ්ට සම්පන්න සමාජයක් නිර්මාණය කිරීම ඉලක්ක කර ගත් පාඨ ග්‍රන්ථ විද්වත් මණ්ඩලයක් හරහා සම්පාදනය කර දහම් පාසල් වෙත ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.94/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාත්‍යන්තර පාසල් නියාමනයට මණ්ඩලයක් පත් කිරීම,— ශ්‍රී ලංකාවේ සංස්කෘතියට, සදාචාරයට හා සමාජ පැවැත්මට ගැලපෙන පරිදි ජාත්‍යන්තර පාසල්හි විෂය පථයන් අවශ්‍ය පරිදි නියාමනය කළ හැකි පූර්ණ බලතල සහිත මණ්ඩලයක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.95/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වඩාත් සක්‍රීය කිරීම,— දේශීය ඉතිහාස දැනුම, සාරධර්ම සම්පන්න බව, නිෂ්පාදන ශක්‍යතාව, බුද්ධි සම්පන්න බව, සම්ප්‍රදායික දැනුම, දේශානුරාගය, නිරෝගීතාව, කුසලතා පූර්ණ බව සහ ආකල්ප සම්පත්තියෙන් යුතු බව යන අංගයන්ගෙන් පරිපූර්ණ සාර්ථක පුරවැසියෙකු බිහි කල හැකි වන පරිදි සකසන ලද ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් හරහා සමස්ත අධ්‍යාපන ක්‍රමයේම පරිවර්තනයක් ඇති කිරීමට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වඩාත් සක්‍රීය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.96/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පවුල් වෛද්‍යාවේදය පිළිබඳ විශේෂඥ සේවාව දියුණු කිරීම,— සෞඛ්‍ය සේවාවේ අත්‍යාවශ්‍ය අංශයක් වන පවුල් වෛද්‍යාවේදය පිළිබඳ විශේෂඥ ක්ෂේත්‍රය තුළ දැනට පවතින ගැටලු නිරීක්ෂණය කර ඒවා කඩිනමින් නිරාකරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමටත් එම පවුල් වෛද්‍යාවේදය පිළිබඳ විශේෂඥ සේවාව දියුණු කිරීමට සැලසුම් කිරීමටත් රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.97/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ආයුර්වේද වෛද්‍යවරුන්ගේ සේවය විදේශයන්ට ලබා දීම,— ආයුර්වේද වෛද්‍ය උපාධිය සම්පූර්ණ කරන උපාධිධාරීන්හට විදේශ රටවල රැකියා අවස්ථා ලබා දීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.98/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ආයුර්වේද වෛද්‍ය පනත සංශෝධනය කිරීම,— දැනට පවතින යල් පැන ගිය ආයුර්වේද වෛද්‍ය පනත සංශෝධනය කර ආයුර්වේද වෛද්‍යවරුන්ගේ වෘත්තීය ගැටලු විසඳමින්, එම වෘත්තිය සතු ගරුත්වය හා අභිමානය රැක ගැනීමට නව ආයුර්වේද වෛද්‍ය පනතක් කඩිනමින් ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.99/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— දුම්රිය ආරක්ෂක පද්ධතියක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ දුම්රිය ආරක්ෂක පද්ධති නිර්මාණය කළ නව නිපැයුම් කරුවන් ද, එම ක්ෂේත්‍රයට සම්බන්ධ විද්වතුන් ද, දුම්රිය දෙපාර්තමේන්තුවේ සියලුම ක්ෂේත්‍රයන්හි ප්‍රවීනයන්ගෙන් ද සමන්විත කමිටුවක් මගින් දුම්රිය ආරක්ෂක පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.100/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මගී ප්‍රවාහන සේවයේ ගුණාත්මක තත්ත්වය වැඩි කිරීම,— බස් මගී ප්‍රවාහන සේවයේ ගුණාත්මක තත්ත්වය වැඩි කිරීම මගින් වාර්ෂිකව එම සේවාව ප්‍රතික්ෂේප කරන 1% - 2% ක් පමණ වූ මගීන් ප්‍රමාණය රඳවා ගැනීමට කටයුතු කිරීමෙන්, එම සේවයේ පැවැත්මට දීර්ඝ කාලීනව ඇති විය හැකි අවදානම අඩු කර ගැනීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.101/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සිංහල භාෂාවට සම්මතයක් සකස් කිරීම,— සිංහල භාෂාවේ ලිඛිත ව්‍යවහාරය හා කථන ව්‍යවහාරය දෙයාකාරයක් ගන්නා අතරම න, ණ, ල, ළ භේදය, අල්පප්‍රාණ, මහප්‍රාණ අක්ෂර යෙදීම සහ පද බෙදීම ආදිය ද විවාද සහිත බැවින් සිංහල භාෂාව සඳහා සම්මතයක් සකස් කිරීමට විද්වත් මණ්ඩලයක් පත් කර කාලානුරූපව සිදුවන වෙනස්කම් ද සැලකිල්ලට ගෙන භාෂාවේ පැවැත්ම තහවුරු කිරීමට හැකි ක්‍රියාදාමයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.102/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සංස්ථානික කාබනික අපද්‍රව්‍ය මගින් පරිසරය දූෂණය වීම පාලනය කිරීම,— පලිබෝධ නාශක සහ කර්මාන්ත ක්‍රියාවලියන්හි දී පිටවන සංස්ථානික කාබනික අපද්‍රව්‍ය (Persistent Organic Pollutants - POPs) දොළොස් වර්ගයක දූෂණ කාරකයන්ගෙන් සමන්විත අතර ඒවා මිනිසාගේ සෞඛ්‍යයට ඉතා අහිතකර බැවින් එම රසායනිකයන් පරිසරයට මුදා හැරීම පාලනය කිරීමට විධිමත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.103/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පාලනයට සම්බුද්ධ දර්ශනය සම්බන්ධ කර ගැනීම,— සප්ත අපරිහානීය ධර්ම, දසරාජ ධර්ම, රාජෝවාද ජාතකය, කුරු ධර්ම ජාතකය, ගන්ධ තින්දුක ජාතකය, තෙසකුර ජාතකය, දේවධර්ම ජාතකය, සතර සංග්‍රහ වස්තු, චක්කවත්ති සීහනාද සූත්‍රය හා ධර්ම ප්‍රදීපිකාව යන සම්බුද්ධ ඉගැන්වීම් සම්බන්ධව පාර්ලිමේන්තු, පළාත් සභා හා ප්‍රාදේශීය මට්ටමේ සිටින සියලුම පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම තුළින් ඔවුන්ගේ භූමිකාව රටේ යහපාලනයට දායක කර ගැනීමට හැකි වන ආකාරයේ වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.104/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීම,— ෆ්ලොරසන්ට් බල්බ, දුරකථන, ජංගම දුරකථන, විදුලි උපකරණ, බැටරි, පරිගණක හා එහි කොටස් ආදිය අපද්‍රව්‍ය ලෙස පරිසරයට බැහැර කිරීමේදී ආසනික්, කැඩ්මියම්, රසදිය, ලෙඩ් වැනි බැර ලෝහ පරිසරයට එකතුවන බැවින් මෙම ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීමට ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කර පරිසරය සුරැකීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.105/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රටේ යහපාලනය ස්ථාපිත කිරීම,— අයහපත් පාලනයේ අංග ලක්ෂණ වන අත්තනෝමතික ප්‍රතිපත්ති සම්පාදනය, නිලබල වාදය, බලාත්මක නොවන සහ අසාධාරණ නීති, විධායක බලතල අනිසි පරිහරණය, දේශපාලනයට පුරවැසි දායකත්වය අඩුවීම සහ දූෂණය පැතිරීම යන කරුණු අප රට තුළ නොඅඩුව දක්නට ලැබෙන අතර මේ නිසා රටේ අයහපත් පාලනයක් පවතින බව පෙනී යන හෙයින් රට තුළ යහපාලනය ගොඩනැගීම සඳහා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.106/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ රටවල ඇති ශ්‍රී ලංකාවට අයත් පුස්කොළ පොත් නැවත ලබා ගැනීම,— ශ්‍රී ලංකාවට අයත් වටිනා පුස්කොළ පොත් රාශියක් යුරෝපා රටවල් ඇතුළු ලෝකයේ රටවල් ගණනාවක තිබෙන අතර ඒවායේ අන්තර්ගතව ඇති දැනුම මේ වන විට වත්මන් ලාංකීය සමාජයට අහිමිව ගොස් ඇති බැවින්, එම පුස්කොළ පොත් අප රටට ආපසු ලබා ගෙන ඒවායේ අඩංගු පෞරාණික දැනුම නැවත සමාජගත කිරීමට විධිමත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.107/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජෛව විවිධත්වය රැක ගැනීම සඳහා කෘෂිකර්මය දායක කර ගැනීම,— ඒක බෝග වගාව වෙනුවට බහු බෝග වගාව සහ මිශ්‍ර බෝග වගාව ජනප්‍රිය කරවීම, ජෛව විවිධත්වයට හානිකර රසායන ද්‍රව්‍ය කෘෂි කර්මාන්තයෙන් ඈත් කිරීම හා ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ ක්‍රම භාවිතය තුළින් රට තුළ ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමට ගොවීන් යොමු කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.108/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජනතාවගේ ආහාර ලැබීමේ අයිතිය සුරක්ෂිත කිරීම,— එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව අයිතිවාසිකම් පද්ධතීන්ට අනුකූලව ආහාර ලැබීමේ මූලික අයිතිවාසිකම ශ්‍රී ලාංකික ජනතාවට අහිමි වන තත්ත්වයක් රජයේ ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම් තුළ දක්නට ලැබෙන හෙයින් උක්ත ප්‍රඥප්තීන්ට අනුව රටේ ජනතාවගේ ආහාර ප්‍රශ්නය විසඳීමේ වගකීම මුළුමනින්ම රජයට පැවරී ඇති බැවින් රජය මැදිහත්වී ආහාර ද්‍රව්‍ය මිල පාලනය හා සෞඛ්‍ය ආරක්ෂිත ආහාර වේලක් රටේ ජනතාවට ලැබීම සහතික කෙරෙන විධිමත් වැඩ පිළිවෙළක් සම්පාදනය කර ජනතාවගේ ආහාර ලැබීමේ මූලික අයිතිවාසිකම තහවුරු කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.109/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අකාබනික ද්‍රව්‍ය කළමනාකරණය කිරීම,— අකාබනික ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමත්, අකාබනික ද්‍රව්‍ය භාවිතය අවම කිරීමත්, භාවිතයෙන් ඉවත්වන අකාබනික ද්‍රව්‍ය එකතු කිරීමේ යාන්ත්‍රණයක් සැකසීම හා අකාබනික ද්‍රව්‍ය භාවිතා කිරීමේ පරිසර නීති රීති විධිමත් කිරීමත් තුළින් රටේ පරිසර පද්ධතියේ ආරක්ෂාව හා යහපැවැත්ම සඳහා අකාබනික ද්‍රව්‍ය කළමනාකරණය කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.110/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය ඖෂධ සහ අත් බෙහෙත් පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීම,— නිරෝගී ජාතියක් ගොඩනැගීම සහ දේශීය ආයුර්වේදයේ යහපැවැත්ම මූලික අරමුණු වශයෙන් ගෙන දේශීය ඖෂධ වර්ග හා අත් බෙහෙත් පිළිබඳ විධිමත් කරුණු සහිත විෂයයක් පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කිරීම මගින් දේශීය ඖෂධ සහ අත් බෙහෙත් පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.111/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මාතෘ හා ළමා මන්දපෝෂණය තුරන් කිරීම,— ශ්‍රී ලංකාව තුළ අඩුබර දරු උපත් අනුපාතිකය 25% තරම් ඉහළ අගයක් ගන්නා අතර එයට ප්‍රධාන සාධකය වන්නේ පෝෂ්‍යදායී ආහාර හිඟකම වන බැවින්, මාතෘ හා ළමා මන්දපෝෂණය දුරලීමට අවශ්‍ය පෝෂ්‍යදායී ආහාර දුප්පත් ජනතාවට ලබා දීම ප්‍රමුඛතාවය කරගත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.112/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසරය සුරැකීමෙන් නිරෝගී රටක් ගොඩනැගීම,— වර්තමාන ශ්‍රී ලංකාවේ පරිසර දූෂණය ඉහළ යාම හේතුවෙන් ජලයේ හා ආහාරවල විකිරණශීලී බව වැඩි වී ඇති අතර අනාගතයේදී මිනිසාට වැළඳෙන ඇතැම් රෝගවල රෝග නිධානය පවා සොයා ගැනීම අපහසු විය හැකි බැවින්, මේ පිළිබඳ වැඩිදුර විමර්ශනය කිරීම සඳහා විද්වත් කමිටුවක් පත් කර වාර්තාවක් කැඳවා, එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම තුළින් රටේ ජනතාවගේ නීරෝගීභාවය සහතික කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.113/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රටේ ආරක්ෂාවට කෘෂිකර්මය සුරක්ෂිත කිරීම,— ධනවාදයේ තුන්වැනි කාර්තුව වන දෙවැනි ලෝක යුද්ධයෙන් පසු කාලයේදී හරිත විප්ලවයත් සමඟ කෘෂිකාර්මික ජීවන රටාව සම්පූර්ණයෙන්ම වෙනස් වීම හේතුවෙන් වර්තමාන ලෝක ප්‍රජාව මුහුණ දී ඇති පරිසර දූෂණය, නීරෝගී බව නැතිවීම හා පිරිසිදු ආහාර නොමැතිවීම ආදී අවදානම් තත්ත්වයන්ගෙන් ශ්‍රී ලංකාව ආරක්ෂා කර ගැනීම සඳහා ජනතාව තිරසාර කෘෂිකර්ම භාවිතයන්ට පෙළඹවීමෙන් හා ගොවීන් ආරක්ෂා කෙරෙන රාජ්‍ය ප්‍රතිපත්ති රට තුළ ස්ථාපිත කරවීමෙන් රටේ අනාගතය සුරක්ෂිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.114/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සංකීර්ණ ගෝලීය වෙළඳපොළ නිසා ජනතාවට ඇතිවන ගැටලු අවම කිරීම,— ගෝලීයකරණය විසින් හඳුන්වාදුන් ලෝක වෙළඳ රටාව මිනිසාගේ මනස ආක්‍රමණය කිරීම හේතුකොට ගෙන ඔහු පාරම්පරිකව ගෙන ආ හර පද්ධතීන් හා දියුණු දාර්ශනික චින්තනයන් මිනිස් මනස තුළින් උදුරා දැමීම වර්තමානය වන විට ශ්‍රී ලාංකිකයින්ට ද පොදු බැවින්, වෙළඳපොළ ආර්ථිකය තුළ ගොඩනැගෙන සංකීර්ණ ජීවන රටාව හා ඒ සමග පැන නගින සංකීර්ණ සමාජීය ප්‍රශ්නත් විසඳා ගනිමින් සහනශීලී දිවි පැවැත්මකට යා යුතු වන්නේ කෙසේද යන්න පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් හා බුද්ධිමය සංවාදයක් රට තුළ ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.115/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවට අවශ්‍ය සීනි රට තුළ නිපදවීම,— ශ්‍රී ලංකාවට අවශ්‍ය කරන සීනි නිෂ්පාදනය කිරීමට අවශ්‍ය සම්පත් ශ්‍රී ලංකාව සතුව ඇති බැවින්, මනා කළමනාකාරීත්වයකින්, කාර්යක්ෂමව හා සැලසුම් සහිතව කටයුතු කර රටට අවශ්‍ය සීනි ප්‍රමාණය මෙරට නිෂ්පාදනය කිරීමට හා සීනි පිරිපහදු කිරීමට අවශ්‍ය කර්මාන්තශාලා රජය මගින් ස්ථාපනය කර සීනි කර්මාන්තය රැක ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.116/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— නකල්ස් රක්ෂිතය ආරක්ෂා කිරීම,— සමස්ත ශ්‍රී ලාංකීය පරිසර පද්ධතියටම බලපෑම් කළ හැකි සංවේදී පරිසර පද්ධතියක් වන නකල්ස් රක්ෂිත වනාන්තරය මේ වන විට මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් දැඩි තර්ජනයකට ලක්වී ඇති අතර වත්මන් පරපුරට මෙන්ම අනාගත මිනිස් පරපුරට ද මෙම පරිසර විනාශය හේතුවෙන් අවදානමකට මුහුණ පෑමට සිදු වන බැවින්, මිනිස් තර්ජන ඉවත් කර නකල්ස් රක්ෂිතයේ ස්වාධීන පැවැත්ම කඩිනමින් තහවුරු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.117/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— රාවණා රජු පිළිබඳව විධිමත් ගවේෂණයක් සිදු කිරීම,— රාවණා රජු පිළිබඳ නිශ්චිත ඉතිහාස තොරතුරු නැති වුවද, විධිමත් ගවේෂණයක් තුළින් ඔහු පිළිබඳව අප රටේ ආකල්ප නැංවීමටත්, රාවණා රජු සතුව තිබූ දැනුම රටේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමට හා ශ්‍රී ලාංකීය ඉතිහාසයේ සැඟවී ගිය පරිච්ඡේදයක් නිරාවරණය කර ගැනීමටත් හැකි වන බැවින්, විද්වත් කමිටුවක් හරහා රාවණා රජු පිළිබඳව ගවේෂණය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.118/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— බුද්ධිමය දිළිඳු බව තුරන් කිරීම,— භෞතික වෙළඳ භාණ්ඩ සැරිසරන වේගයට සාපේක්ෂව දැනුම, බුද්ධිය හා මානව හර පද්ධතීන් ජනතාව වෙත ළඟා නොවීම හේතුවෙන් නොදැනුවත්කම හිස එසවීම තුළින් බුද්ධිමය දිළිඳුභාවය අද අප රට තුළ දක්නට ලැබෙන ප්‍රධාන ගැටලුවක් වුවද, ඒ පිළිබඳව රට තුළ ඇත්තේ අඩු අවධානයක් බැවින්, රටේ ජනතාවගේ බුද්ධිමය දිළිඳු බව නැති කිරීමට සියලු වයස් කාණ්ඩයන් ආවරණය වන පරිදි විධිමත්ව සැලසුම් කරන ලද ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.119/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— කල් ඉකුත් වූ ඖෂධ භාවිතය නැවැත්වීම,— මේ වන විට ශ්‍රී ලංකාව තුළ කල් ඉකුත් වූ ඖෂධ වෙළඳපොළට හා රජයේ රෝහල් තුළ භාවිතයට පැමිණීමේ අවදානමක් ඇති බැවින් රජයේ අදාළ සියලු අංශ මැදිහත්වී ක්‍රියාකාරී සැලසුමක් සකස් කර කල් ඉකුත් වූ ඖෂධ වෙළඳපොළෙන් ඉවත් කිරීම හා ආනයනය කිරීම නැවැත්වීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.120/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඒඩ්ස් රෝගය ව්‍යාප්ත වීම පාලනය කිරීම,— ශ්‍රී ලංකාව තුළ දැනට හඳුනා නොගත් ඒඩ්ස් රෝගීන් 3000 කට ආසන්න ප්‍රමාණයක් සිටින බවට වාර්තා පළ වී ඇති බැවින් ඔවුන් හඳුනාගෙන ප්‍රතිකාර සඳහා යොමු කිරීමටත්, ඒඩ්ස් රෝගය ව්‍යාප්ත වීම වැළැක්වීමටත් ඵලදායී සුදුසු ව්‍යාපෘතියක් කඩිනමින් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.121/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශයන්හිදී ලිංගික අතවරයට ලක්වන කාන්තාවන්ට සහන සැලසීම,— ශ්‍රී ලංකාවේ කාන්තාවන් ගෘහ සේවයට විදේශ ගතවීමෙන් පසු සිදු වන අතවරයන් හේතුවෙන් සිදුවන ගැබ් ගැනීම් නිසා ශ්‍රී ලාංකීය සමාජය තුළ නිර්මාණය වී ඇති ගැටලු සහගත තත්ත්වයන් සමනය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකසා ක්‍රියාත්මක කිරීමට විද්වතුන් හා එම සිදුවීම් හා බැඳුණු පුද්ගල කණ්ඩායම්වලින් සැදුම්ලත් කමිටුවක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.122/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වන රක්ෂිත හා අභය භූමිවල ආරක්ෂාව දැඩි කිරීම සඳහා නීති සම්පාදනය කිරීම,— මෑතක සිට ශ්‍රී ලංකාවේ රක්ෂිත වනාන්තර සහ අභය භූමි විනාශය වැඩි වෙමින් පවතින අතර ශ්‍රී ලාංකීය පාරිසරික සමතුලිතතාවට ඉන් දැඩි තර්ජනයක් එල්ල වෙමින් පවතින බැවින් මෙම විනාශය නැවැත්වීම සඳහා ජනතාවගේ ආකල්පමය වෙනසක් ඇති කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් සැකසීමට මෙන්ම පවතින නීති ප්‍රතිපාදන විධිමත් හා දැඩි බවකින් යුක්ත වන ලෙස සංශෝධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.123/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විවිධ ආගමික කණ්ඩායම්වලින් සිදු වන සමාජ බලපෑම් පිළිබඳව අධ්‍යයනය කිරීම,— ප්‍රධාන ධාරාවේ ආගමික මතවාදයන් විවේචනය කරමින්, එම ආගම්හි අනු කණ්ඩායම් ලෙස තම නිර්වචන හා පැහැදිලි කිරීම් සමාජගත කරන, නව මතවාද ඉදිරිපත් කරමින් එම මතවාද පිළිගත් පුද්ගලයින් එක් රැස් කර ගන්නා, ආගමික හා වෙනත් මුහුණුවරකින් සමාජගත වී ඇති කණ්ඩායම් පිළිබඳ අධ්‍යයනය කරමින් ඔවුන්ගේ මතවාද, ක්‍රියාකාරීත්වයන් හා සමාජයට ඔවුන් නිසා ඇති වන බලපෑම් කවරාකාරද යන්න පිළිබඳ තක්සේරුවක් ලබා දීමට පිළිගත් ආගමික නායකයන්ගෙන් හා විද්වතුන්ගෙන් සැදුම් ලත් කමිටුවක් පත් කර, වාර්තාවක් කැඳවා එහි නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.124/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉහළ ප්‍රමිතියෙන් යුත් මැටි භාජන නිෂ්පාදනය කිරීම,— ආහාර පිසීමේදී ගෑස් හා විදුලිය අපතේ නොයන ලෙස ඉක්මනින් තාපය අවශෝෂණය කර ගන්නා මැටි භාජන නිෂ්පාදනය කර වෙළඳපොළට ඉදිරිපත් කිරීමට, අවශ්‍ය පරීක්ෂණ සිදු කිරීමට හා මැටි භාජන භාවිතයෙන් සෞඛ්‍යාරක්ෂිතව ආහාර පිසීමට ඇති හැකියාව පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට ජාතික මට්ටමේ වැඩ සටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.125/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අධිමානසික විද්‍යා ක්ෂේත්‍රයට බුදු දහමින් ආභාෂය ලබා ගැනීම,— බුදුන් වහන්සේගේ සිත පිළිබඳ ඇතැම් විග්‍රහයන් නූතන විද්‍යාවට හසු නොවන තරම් ගැඹුරු බැවින්, ඒ පිළිබඳ පර්යේෂණ කිරීමට හා වර්තමානයේ අධිමානසික විද්‍යා ක්ෂේත්‍රයේ ඇති ගැටලු සඳහා බුදු දහම ඇසුරින් නිර්වචන හා විසඳුම් ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි, අදාළ ක්ෂේත්‍රය පිළිබඳ හසල දැනුමක් ඇති දේශීය හා විදේශීය විද්වතුන්ගෙන් සමන්විත කමිටුවක් පිහිටුවා, ඒ හරහා බුදු දහම දේශීය හා විදේශීය වශයෙන් ප්‍රචලිත කිරීමටත්, ශ්‍රී ලංකාවේ කීර්ති නාමය ඉහළ නැංවීමටත්, අධිමානසික විද්‍යා ක්ෂේත්‍රයේ පුනරුදයක් ඇති කිරීමටත් රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.126/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විද්‍යාර්ථීන් අතර පුරාවිද්‍යා විෂයය ජනප්‍රිය කරවීම,— විද්‍යාර්ථීන් අතර පුරාවිද්‍යා විෂයය ජනප්‍රිය කිරීම සඳහා මූලික වශයෙන් පාසල් විෂයය නිර්දේශයට එම විෂයය ඇතුළත් කිරීම හා විශ්වවිද්‍යාලවල පුරාවිද්‍යා විෂය පථය තවදුරටත් පුළුල් කිරීමට හා පහසුකම් ලබාදීම සඳහා කටයුතු කිරීමත්, එමගින් පුරාවිද්‍යා විෂයය රට තුළ ව්‍යාප්තවීම හරහා බිහිවන උගතුන්ගෙන් රටට යහපත් සේවයක් ලබා ගැනීමත් අරමුණු කරගත් ජාතික වැඩසටහනක් දිගුකාලීනව සැලසුම් සහිතව නිර්මාණය කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.127/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ආහාරවල ඇති වස විෂ පිළිබඳ සොයා බැලීමට විශේෂ ප්‍රමිති ආයතනයක් පිහිටුවීම,— කෘෂිකර්මාන්තයේදී භාවිතා කෙරෙන රසායන ද්‍රව්‍ය හේතුවෙන් ආහාර ද්‍රව්‍යයන්ට ද වස විෂ මිශ්‍රවී ඇති අතර, ඒ පිළිබඳව සොයා බැලීමට අදාළ ප්‍රමිති ආයතනයක් දැනට ශ්‍රී ලංකාව තුළ පිහිටුවා නොමැති බැවින් එම කාර්යය සඳහා විශේෂ ප්‍රමිති ආයතනයක් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.128/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— යාචකයින් සිඟමනට යොදාගන්නා දරුවන් පුනරුත්ථාපනය කිරීම,— ශ්‍රී ලංකාවේ යාචකයින් දරුවන් සමග සිඟමන් යැදීම තහනම් කර, සිඟමන සඳහා යොදා ගන්නා දරුවන් පුනරුත්ථාපනය කර, ඔවුන් යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීම සඳහා අවශ්‍ය ජාතික මට්ටමේ වැඩපිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.129/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ භික්ෂුණී ශාසනය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කිරීම,— මහා ප්‍රජාපතී ගෝතමී තෙරණීන්වහන්සේගෙන් ඇරඹුණු භාරතීය භික්ෂුණී ශාසනය සංඝමිත්තා තෙරණීන්වහන්සේගේ ලංකාගමනයෙන් ශ්‍රී ලංකාව තුළ මැනවින් ස්ථාපිත වුවද, පසුකාලීනව අභාවයට ගිය බැවින්, මෑත යුගයේ දී ශ්‍යාමෝපාලි මහා නිකායේ රංගිරි දඹුලු පාර්ශ්වය විසින් යළි ස්ථාපනය කරන ලද අතර, එලෙස ස්ථාපනය කරන ලද භික්ෂුණී ශාසනයට නිසි පිළිගැනීමක් ලබාදීම සඳහා රජය ත්‍රෛනිකායික මහා නායක ස්වාමීන්වහන්සේලා ඇතුලු අදාළ සියළු ක්ෂේත්‍රයන්ගේ මූලිකත්වයෙන් නිසි සංවාදයක් ඇරඹිය යුතු යැයි ද, එම සංවාදය අවසානයේ විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ ශ්‍රී ලංකාව තුළ භික්ෂුණී ශාසනය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා වැඩපිළිවෙළක් සැකසිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.130/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකීය භික්ෂු සංස්ථාව ව්‍යුහාත්මකව විධිමත් කිරීම,— ශ්‍රී ලාංකීය භික්ෂු සංස්ථාව තුළ සංඝයාවහන්සේලා පාර්ශ්ව ගත වීම හේතුවෙන් ව්‍යුහාත්මකව අසංවිධිත වී ඇති අතර එම නිසා ජාතික හා ජාත්‍යන්තර අභිචාර උපචාරයන්හිදී සංඝයා වහන්සේලා ඒකමතික නොවීම රටට අහිතකර ලෙස බලපාන බැවින් සමස්ථ සංඝ සමාජයේ ඒකමතිකත්වය ඇති කර ගැනීමට හැකි වැඩපිළිවෙළක් සැකසීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.131/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලාභදායී ආයතනයක් කිරීම,— ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලාභදායී ආයතනයක් ලෙස ජනතාවාදීව සංවර්ධනය කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීමට විද්වත් මණ්ඩලයක් පත් කර ඔවුන්ගේ නිර්දේශයන්ට අනුව සංස්ථාවේ පවතින වංචා, දූෂණ හා පරිපාලනමය ගැටලු විසඳා ඵලදායී ජාතික ආයතනයක් ලෙස ක්‍රියාත්මක වීමට අවශ්‍ය පරිසරය රජය මැදිහත්ව නිර්මාණය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.132/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඖෂධ සඳහා අවශ්‍ය ප්‍රමාණයට ගංජා වැවීමට දේශීය වෛද්‍යවරුන්ට අවසර ලබා දීම,— ඉන්දියාවේ සිට රහසිගත මාර්ග ඔස්සේ රට තුළට ගෙන්වන රසායනික ද්‍රව්‍ය මිශ්‍රිත ගංජා භාවිතා කර නිපදවන දේශීය ඖෂධවල ගුණාත්මක බව අඩුවන බැවින්, ආයුර්වේද ඖෂධ නිපදවීමේදී තම ඖෂධවල ගුණාත්මක බව ආරක්ෂා කර ගැනීම සඳහා ගංජා අත්‍යවශ්‍ය ඖෂධයක් ලෙස යොදා ගන්නා රජයේ පිළිගත් ආයුර්වේද වෛද්‍යවරුන්ට සීමාවන් සහිතව ගංජා ශාකය වැවීමට අවසර ලබාදීම සඳහා අවශ්‍ය නීති සංශෝධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.133/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— එළවළු ගොවීන්ට සාධාරණ මිලක් ලබා දීම,— එළවළු තොග වෙළඳාමේදී ක්‍රියාත්මක වන කප්පම් ගැනීම හා මිල තීරණය කිරීම් ආදී ක්‍රියා හරහා ගොඩනැගී ඇති සංවිධානාත්මක වෙළඳ ඒකාධිකාරයන් නිසා එළවළු ගොවීන්ට සාධාරණ මිලක් ලබා දීමට මෙතෙක් ක්‍රියාත්මක කළ සැලසුම් අසාර්ථක වී ඇති බැවින්, ගොවියාට සාධාරණ මිලක් ලබා දීමේ මූලික අරමුණ කරගත් බලපෑම් වලින් තොර වෙළඳපොළක් රාජ්‍ය වෙළඳ ආයතන මැදිහත්වී නිර්මාණය කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.134/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් දරුවන්ගේ වටිනාකම සමාජගත කිරීම,— දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන් හා පාසල් වෑන් රථ රියැදුරන් යන පිරිස් සඳහා දරුවන්ගේ වටිනාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක ක්‍රමවේදයන් තුළින් සරළව පැහැදිලි කර, රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම සඳහා දරුවා සමාජ අභියෝගයන් හමුවේ ආරක්ෂා කරන්නේ කෙසේද යන්න පිළිබඳව සංවාදයක් පැවැත්වීමට ජාතික මට්ටමේ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.135/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කාන්තාවන්ට ඇතිවන පීඩාවන් අවම කිරීම,— වත්මන් ගෝලීය සමාජය තුළ කාන්තාවන්ට සිදුවන පීඩාවන් වන ශ්‍රම හා ලිංගික සූරාකෑමට ලක්වීම, පෞද්ගලික දේපළ ක්‍රමය පුරුෂ කේන්ද්‍රීයව විකාශනය වීම, අසමාන ලෙස සැලකීම හා පවුල් සංස්ථාව තුළ සිරගත වීම නිසා ශ්‍රම සංචලතාවයට බාධා ඇතිවීම යන කරුණු ශ්‍රී ලාංකික කාන්තාවන්ට ද ප්‍රධාන වශයෙන් පොදු වන බැවින්, ඔවුන්ගේ යහපැවැත්ම වෙනුවෙන් මෙම පීඩාකාරී වාතාවරණය සමනය කර සහන සැලසීමට අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.136/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව නගා සිටුවීම,— ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති පුරාවස්තු සංරක්ෂණය කිරීමට හැකියාවක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට නොමැත්තේ පවත්නා මානව හා භෞතික සම්පත්හි අඩුව නිසා වන හෙයින්, විද්වත් මණ්ඩලයක් මගින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඇති අඩුපාඩුකම් පිළිබඳ සොයා බලා, ඒවා සම්පූර්ණ කිරීමට අවශ්‍ය පියවර ගැනීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.137/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— දුර ගමන් සේවා බස් රථවල ගමන් ගන්නා මගීන්ට සෞඛ්‍යාරක්ෂිත ආහාර පාන ලබා ගැනීමට පහසුකම් සැලසීම,— දුර ගමන් සේවා බස් රථ ආහාර පාන ගැනීම සඳහා නතර කරනු ලබන ආපනශාලාවන්හි ප්‍රමිතිය ඉතා පහළ මට්ටමක පවතින බැවින් එය මගී ජනතාවගේ සෞඛ්‍යයට අහිතකර වන අතර, එම ආපනශාලාවල ප්‍රමිතිය ඉහළ නැංවීමට නිරන්තරව පසු විපරම් කළ හැකි වන පරිදි සකස් කරන ලද ජාතික වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.138/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රජය සතු වැවිලි සමාගම් ලාභදායී ආයතන බවට පත් කිරීම,— රජය සතු වැවිලි සමාගම් පාඩු ලබන ආයතන බවට පත්වී ඇති බැවින්, විද්වත් කමිටුවක් පත්කර එම ආයතනවල ලාභදායීත්වය වර්ධනය කිරීමට අවශ්‍ය නිර්දේශ සකස් කර, එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම තුළින් එම සමාගම්වල ලාභදායීත්වය ඉහළ දැමීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.139/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වන රක්ෂිත තුළ සිදුවන නීති විරෝධී ක්‍රියා නැවැත්වීම,— ශ්‍රී ලංකාවේ වන රක්ෂිත තුළ සිදුවන නීති විරෝධී වගාවන්, විවිධ ඉදිකිරීම්, වනාන්තර එළිකිරීම් හා රක්ෂිත සීමා මායිම් වෙනස් කිරීම ආදී වන විනාශයට හේතුවන මිනිස් ක්‍රියාකාරකම් වැටලීමට විශේෂයෙන් සවිබල ගන්වන ලද පොලිස් වන ආරක්ෂක ඒකකයක් පිහිටුවීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.140/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කොරල්පර සංරක්ෂණය කිරීම,— සාගර ජලයේ උෂ්ණත්වය ඉහළ යෑම හා මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් කොරල්පර විනාශ වීමේ තර්ජනයට ලක්ව ඇති බැවින්, ශ්‍රී ලංකා මුහුදු කලාපය අවට ඇති කොරල්පර ආරක්ෂා කර ගැනීමට හා නව කොරල්පර නිර්මාණය වීමට උචිත පරිසර පද්ධති සකස් කිරීම සඳහා අවශ්‍ය නව නියාමනයන් සකස් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.142/'15

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා,— ඔලුවිල්, පාලමුනේ වරාය ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීම,— මීටර් 400 ක පමණ ප්‍රදේශයක් තුළ පිහිටි ජනතාව පදිංචි ඉඩම් සමුද්‍ර ඛාදනයට ලක්වී ඇති බැවින් සහ එම ප්‍රදේශයේ දීර්ඝ කාලයක් තිස්සේ පැවති ජලාපවහන පද්ධතිය අවහිර වීම හේතුවෙන් ප්‍රදේශ 10 කට අධික ගම්මානවල ඩෙංගු වැනි මාරාන්තික රෝග පැතිරෙමින් තිබෙන බැවින් සහ ප්‍රදීපාගාරය ද, වරාය සතු නිවාඩු නිකේතනය ද, සමුද්‍ර ඛාදනය නිසා අවදානම් සහගත තත්ත්වයකට පත් වී ඇති බැවින් ඔලුවිල්, පාලමුනේ වරාය ආශ්‍රිතව ඉදිකරනු ලබන දිය කඩනයේ වැඩ කටයුතු සම්පූර්ණ කළ යුතු බවටත්, එකී ධීවර වරාය එම ප්‍රදේශයේ ජනතාවට ප්‍රයෝජනවත් විය යුතු බවටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.143/'15

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා,— ගවයින් සඳහා සුදුසු තෘණ බිම් වෙන් කිරීම,— ආසන්න වශයෙන් ගවයින් 250,000කට පමණ තෘණ භූමි අවශ්‍යව සිටින බැවින් සහ කිරි නිෂ්පාදනය වැඩි කිරීමේ රජයේ ප්‍රතිපත්තිය සපුරාගැනීම සඳහා වෙන් කරන ලද තෘණ භූමි දිස්ත්‍රික්කය තුළ පිහිටා නොමැතිකම නිසා, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ සුදුසු තෘණ භූමි ප්‍රකාශකර, වෙන්කර ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.144/'15

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ආගමික පාසල් අධ්‍යාපනය අනිවාර්ය කිරීම,— ශිෂ්ට සම්පන්න සමාජයකට නොගැලපෙන අයුරින් රට තුළ ව්‍යාප්ත වන අපචාර හා බාල අපරාධ මර්ධනය කිරීම හා ස්වයං විනයක් ඇති කිරීම සඳහා දීර්ඝ කාලීන පිළියමක් ලෙස පාසල් සිසුන් ඉරිදා උදෑසන දහම් පාසල්, අහදියා (ආගමික) පාසල් යෑම අනිවාර්ය කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.145/'15

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— රජයේ ආයතනවලින් ජනතාවට සිදුවන අකටයුතුකම් පිළිබඳ සොයා බැලීමට ආයතනයක් පිහිටුවීම,— රජයේ ආයතන මගින් විවිධ සේවාවන් ලබාගැනීම සඳහා පැමිණෙන මහජනතාවට සිදුවන අකටයුතුකම් සහ අසාධාරණකම් පිළිබඳ සොයා බැලීම සඳහාත්, එම අසාධාරණකම් විභාග කිරීම සඳහාත් නෛතික බලයක් සහිත ආයතනයක් ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.147/'15

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— යුද්ධය නිසා දිවි අහිමි වූ ජනතාව සිහි කිරීම සඳහා අනුස්මරණ ස්මාරකයක් තැනීම සහ සිහිපත් කිරීම සඳහා පොදු දිනයක් වෙන් කිරීම,— දශක ගණනාවක සිට උතුරු පළාතේ පැවති යුදමය වාතාවරණය තුරන් වී සාමකාමී ජීවන රටාවකට ජනතාව දැන් අවතීර්ණ වී සිටින අතර පසුගිය කාලයේ පැවති අසාමාන්‍ය තත්ත්වයන් නිසා ද, යුදමය වාතාවරණය හේතුවෙන් ද, ඝාතනයට ලක්වූ සියලු ජාති, ආගම් හා සමාජවලට අයත්, සියලුම භාෂාවන් කතාකරන ජනතාව, ශ්‍රී ලාංකිකයින් ලෙස සිහිපත් කරමින්, එම ජනතාව මචබිම වෙනුවෙන් ද, ඔවුන් කළ පරිත්‍යාගයන්වලට ගෞරව කිරීම සඳහා ද, උතුරු පළාතේ ඕමන්තේ ප්‍රදේශය තුළ සුදුසු ස්ථානයක "අනුස්මරණ ස්මාරකයක්" තැනීමට ද, එම යුදමය තත්ත්වය නිසා දිවි අහිමි වූ සියලුම ජාති, ආගම් හා භාෂාවන් කථා කරන ජනතාව සිහිගැන්වීම සඳහා සුදුසු දිනයක් නම් කොට සෑම වසරක් පාසාම එම දිනය සැමරීමට ද රජය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.149/'15

ගරු හේෂා විතානගේ මහතා,— මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පිළිබඳ නිසි ප්‍රමිතියක් ඇති කිරීම,— ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යන මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන බහුතරයක් සුදුසුකම් ලත් පාලිකාවන් නොමැතිවීම, නුසුදුසු ස්ථානයක පවත්වාගෙන යාම සහ දරුවන්ට නොගැලපෙන විෂය පථයක් ඉගැන්වීම සහ නිසි ප්‍රමිතියකින් තොරවීම මෙන්ම, මේවා වැඩිදියුණු කිරීම පිණිස පළාත් සභා මගින් සිදු කර ඇති මැදිහත් වීම ද සතුටුදායක තත්ත්වයක නොමැති බැවින් අනාගත දරු පරපුර වෙනුවෙන් මහඟු මෙහෙයක් කිරීම අරමුණු කොට මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන වල ප්‍රමිතිය ඉහළ නැංවීම සඳහා ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.150/'15

ගරු හේෂා විතානගේ මහතා,— උපාධිධාරීන් සඳහා රැකියා ලබා දීමේදී නිසි ක්‍රමවේදයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ උපාධිධාරීන්ට රැකියා ලබා දීමේදී මෙතෙක් කල් ක්‍රියාත්මක වූ පක්ෂ පාට භේද ක්‍රමය නොසලකා සාධාරණය ඉටුකිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සැලසුම් කර එය ප්‍රතිපත්තියක් ලෙස සම්මත කිරීමට පියවර ගන්නා ලෙසත්, දේශපාලනඥයන් හමුවේ උපාධිධාරීන් හැල්ලුවට පත් නොකිරීමට වගබලා ගත යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.151/'15

ගරු හේෂා විතානගේ මහතා,— වතු ආශ්‍රිතව ජීවත්වන දමිළ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම,— වතු ආශ්‍රිත දමිළ ජනතාව ජීවත්වන පරිසරය තුළ විදුලිය, ජල පහසුකම් සහ යටිතල පහසුකම් අවම මට්ටමක පවතින අතර එම තත්ත්වය පාසල් දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලටත්, එම ජනතාවගේ පෞද්ගලික ජීවිතයටත් බාධා ඇතිකරන බැවින්, මෙම ලයින් නිවාස සංස්කෘතිය නිමා කර ඒ සඳහා නව වියිමත් තනි නිවාස ක්‍රමයක් සකස් කිරීමට අවශ්‍ය කඩිනම් වැඩසටහනක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.153/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— දේශපාලන හේතූන් මත දිවි නැගුම ප්‍රතිලාභ අහිමිකර ඇති අයට කඩිනමින් සහන සැලසීම,— දිවයින පුරා ක්‍රියාත්මක දිවි නැගුම වැඩසටහන යටතේ දිවි නැගුම දීමනා ලැබිය යුතු විශාල දිළිඳු පිරිසකට දේශපාලන හේතූන් මත එම දීමනාවන් ලබා ගැනීමේ අවස්ථාවන් මග හැරී ඇති බැවින්, කිසිදු භේදයකින් තොරව එම දීමනාවන් ලැබිය යුතු සියලුම දිළිඳු අයට කඩිනමින් ලබා දීමට අවශ්‍ය කටයුතු සැලසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.154/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර දිස්ත්‍රික්කය තුළ මහල් නිවාස යෝජනා ක්‍රමයක් ආරම්භ කිරීම,— මහනුවර දිස්ත්‍රික්කයේ පවතින ඉඩම් හා නිවාස හිඟයට පිළියමක් වශයෙන් මහනුවර ප්‍රදේශයේ පිහිටා ඇති රාජ්‍ය වැවිලි ආයතනවලට අයත් වගා නොකළ ඉඩම් තෝරාගෙන මහල් නිවාස ක්‍රමයක් ඇතිකොට නිවාස නොමැති මහනුවර දිස්ත්‍රික් මධ්‍යම පාන්තික ජනතාවට කඩිනමින් නිවාස ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.155/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— වසර 12 ක ක්‍රියාන්විත රාජකාරියේ නිරතව සිටි ත්‍රිවිධ හමුදා සෙබළුන්ට විශ්‍රාම වැටුප් ලබා දීම,— ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදා සේවයේ වසර 22 ක් සම්පූර්ණ වූ පසු විශ්‍රාම යෑමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක වන බැවින්, උතුරු නැගෙනහිර ක්‍රියාන්විත රාජකාරියේ නියැලී වසර 12 ක් අඛණ්ඩව සේවය කොට එම සේවාවෙන් ඉවත් වී සිටිනා අයවලුන් දැනට ඉතා අසරණ තත්ත්වයෙන් පසුවන බැවින් එම ත්‍රිවිධ හමුදාවේ හා පොලීසියේ සේවය කළ අයට අර්ධ විශ්‍රාම වැටුපක් ලබා දීමේ ක්‍රමවේදයක් කඩිනමින් සකසා එම අයට සහනයක් සැලසීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.156/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර නගරය තුළ පවත්නා මාර්ග තදබදය අවම කිරීම,— ශ්‍රී ලංකාවේ දෙවැනි අගනගරය වන මහනුවර නගරය දේශීය හා විදේශිකයන්ගේ සංචාරක මධ්‍යස්ථානයක් වන හෙයින් ද, මහනුවර නගරයට එදිනෙදා විශාල පිරිසක් පැමිණෙන අතර එම ජනතාව මහනුවර නගරයේ හා අවට මාර්ගවල ඇති අධික රථ වාහන තදබදය නිසා මහත් අසීරුතාවයකට පත්වන බැවින් ද, මහනුවර නගරයේ මාර්ග තදබදය අවම කිරීම සඳහා කඩිනම් විසඳුමක් ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.157/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර නගරය තුළ මුස්ලිම් පිරිමි පාසලක් ආරම්භ කිරීම,— මහනුවර දිස්ත්‍රික්කය තුළ මුස්ලිම් ජනතාව ඉතා වැඩි පිරිසක් ජීවත් වන අතර, මහනුවර නගරය ආශ්‍රිතව මුස්ලිම් පිරිමි පාසලක් පිහිටුවිය යුතු යැයි දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රදේශයේ මුස්ලිම් ජනතාවගේ ද ඉල්ලීමක්ව පවතින බැවින්, ඉතා කඩිනමින් මහනුවර නගරයේ මුස්ලිම් පිරිමි පාසලක් පිහිටුවීමට අවශ්‍ය කටයුතු සැලසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.158/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර නගරය තුළ පිහිටි ජනප්‍රිය පාසල් සඳහා පළමු ශ්‍රේණියේ දරුවන් වෙනුවෙන් නව ගොඩනැගිලි ඉදිකිරීම,— මහනුවර නගරය ආශ්‍රිතව ජනප්‍රිය පාසල් සඳහා පළමුවැනි ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමට විශාල පිරිසක් ඉල්ලුම් කළත්, එම පාසල්වල ඉඩකඩ සීමිත හෙයින්, දරුවන් ඇතුළත් කිරීම ඉතා අසීරු වී ඇති බැවින් මහනුවර නගරය ආශ්‍රිත ප්‍රධාන පාසල්වලට පළමුවැනි ශ්‍රේණියේ පන්ති පැවැත්වීම සඳහා නව ගොඩනැගිලි ඉතා කඩිනමින් ඉදිකර දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.159/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර පල්ලේකැලේ නිදහස් වෙළඳ උද්‍යාන ක්‍රමවත්ව පුළුල් කිරීම,— මහනුවර දිස්ත්‍රික්කය තුළ විරැකියාවෙන් පෙළෙන තරුණ තරුණියන් විශාල පිරිසක් සිටින බැවින්, එම අයට රැකියා අවස්ථා කඩිනමින් සපයා දීම සඳහා මහනුවර පල්ලේකැලේ ප්‍රදේශයේ පිහිටා ඇති නිදහස් වෙළඳ උද්‍යාන දෙක ක්‍රමවත් ලෙස සකසා වැඩි පිරිසකට රැකියා අවස්ථා ලබා ගැනීමට අවස්ථාව සැලසීමට කඩිනමින් කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.160/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාව යළි ස්ථාපනය කිරීම,— අධිරාජ්‍යවාදී පාලන කාලයේදී අසරණ වූ උඩරට ප්‍රදේශවාසී ජනතාවට සහන සැලසීම උදෙසා ස්ථාපිත කර තිබූ උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාව පසුගිය පාලන කාලය තුළ අක්‍රිය තත්ත්වයට පත් කිරීම නිසා උඩරට ජනතාවට සිදුවී ඇති අසාධාරණයන් සාධාරණය කිරීම සඳහා උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාව නැවත ක්‍රමවත්ව ස්ථාපිත කරලීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සැලසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.161/'15

ගරු ජේ. සී. අලවතුවල මහතා,— සමස්ත ලංකා මට්ටමේ ජයග්‍රහණ ලැබූ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අධ්‍යාපන ක්ෂේත්‍රයේ පත්වීම් ලබා දීම,— සමස්ත ලංකා පාසල් ක්‍රීඩා තරඟාවලිය/ යෞවන සමාජ ක්‍රීඩා උළෙල/ ජාතික මහා ක්‍රීඩා උළෙල ආදී තරඟ වලින් සමස්ත ලංකා මට්ටමින් පළමුවැනි, දෙවැනි හා තෙවැනි ස්ථාන හිමි කරගත් ක්‍රීඩකයින් සහ සමූහ තරඟවලදී ශූරතාව හා අනු ශූරතාව දිනූ කණ්ඩායමේ ක්‍රීඩකයින්ට අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්‍රීඩා ගුරුවරුන් ලෙසත් ක්‍රීඩා නිලධාරීන් ලෙසත් පුහුණුවක් ලබාදී තනතුරු ලබාදීමේ වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.162/'15

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— උතුරු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පවතින ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ සේවක සංඛ්‍යා පුරප්පාඩු, ජ්‍යෝෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කරගෙන පිරවීම සහ තරඟ විභාගයෙන් නිදහස් කර III ශ්‍රේණියට පත්කිරීම,— උතුරු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ පවතින ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ සේවක සංඛ්‍යා පුරප්පාඩු පිරවීම සම්බන්ධව නිසි විශ්ලේෂණයක් කර මෙම තනතුරුවලට අදාළ රාජකාරිවල නිරත ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ හා ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරීන්ගේ ජ්‍යෝෂ්ඨත්වය හා කුසලතාවය සැලකිල්ලට ගෙන ඔවුන් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ තරඟ විභාගයෙන් නිදහස් කර අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.163/'15

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— උතුරු පළාතේ පළාත් සභාව යටතේ ඇති පාසල්වල වැඩ බලන විදුහල්පතිවරුන් විදුහල්පති තරඟ විභාගයෙන් නිදහස් කර, එම නිලධාරීන් විදුහල්පති සේවයේ III ශ්‍රේණියට පත් කිරීම,— උතුරු පළාත් සභාව යටතේ ඇති පාසල්වල දීර්ඝ කාලයක් සේවයේ නියුතු ශ්‍රී ලංකා ගුරු සේවයට අයත් වැඩබලන විදුහල්පතිවරුන්ගේ ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ තරඟ විභාගයෙන් නිදහස් කර, එම නිලධාරීන් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.167/'15

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— හජ් වන්දනා පනතක් හඳුන්වා දීම,— ශ්‍රී ලංකාවේ සිට වාර්ෂිකව හජ් වන්දනාවේ යෙදෙන බැතිමතුන් විසින් මුහුණ දෙන ගැටලු නිරාකරණය කර ගැනීමටත්, ඒ පිළිබඳ ආයතනික ව්‍යුහයක් ස්ථාපනය කොට නීතිමය ප්‍රතිපාදන සකස් කිරීමටත්, රජය මගින් "හජ් වන්දනා පනතක්" හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.168/'16

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ජාතීන් අතර ජාතික සංහිඳියාව ගොඩනැංවීම,— ජාතික සංහිඳියාව හා ජාතීන් අතර අන්‍යෝන්‍ය අවබෝධය සහ එකමුතුව වඩාත් ඵලදායී ලෙස ගොඩනැගීම සඳහා දීර්ඝ කාලීන ඉලක්කයන්ට මුල පිරීමේ අරමුණින්, ශ්‍රී ලංකාව තුළ සෑම දෙමළ මාධ්‍ය පාසලකම සිංහල මාධ්‍යයෙන් උගන්වන අංශයක් ආරම්භ කළයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.169/'16

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— නව ක්‍රීඩා පනතක් හඳුන්වාදීම,— දිස්ත්‍රික් ක්‍රීඩා සංගම්වල ඡන්දයෙන් ක්‍රීඩා පාලක මණ්ඩලවලට නිලධාරීන් තේරී පත්වීමේ ක්‍රමය වෙනුවට අලුත් ක්‍රමවේදයක් හඳුන්වා දී, එමගින් එම නිලධාරීන්ගේ ක්‍රියා කලාපය, මහජනතාවට හෝ පාර්ලිමේන්තුවට හෝ වගකියන අයුරින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවේ දියුණුව සහ අභිවෘද්ධිය සඳහා නව ක්‍රීඩා පනතක් හඳුන්වා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---

## 2016 මැයි මස 18 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

11/'15

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකා නාවික හමුදාව මගින් ඉටු කරන ලද සාගර ආරක්ෂා කටයුතු, මුහුදු කොල්ලකෑම් වැළැක්වීම සහ දේශිය හා විදේශිය නැව්වලට ආරක්ෂාව සැපයීම යන සේවා 2012 සැප්තැම්බර් 18 දින සිට ඇවන්ට්ගාර්ඩ් සමාගම වෙත පවරා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) නාවික හමුදාව සහ ඇවන්ට්ගාර්ඩ් සහ සීමාසහිත රක්නා ආරක්ෂණ ලංකා සමාගම අතර පවත්නා ගිවිසුම කුමක්ද; එහි ප්‍රධාන කොන්දේසි කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඇවන්ට්ගාර්ඩ් සමාගම සහ නාවික හමුදාව අතර පවත්නා සේවා සම්බන්ධතාවය කවරේද;

(ii) ඇවන්ට්ගාර්ඩ් සමාගමේ ආරක්ෂක සේවා කටයුතු සඳහා නාවික හමුදාවේ නිලධාරීන් සහ ආයුධ යොදවන්නේද;

(iii) එසේ නම්, ඒ කවර පදනමකින්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) වර්ෂ 2012 සිට 2015 දක්වා,

(i) ඇවන්ට්ගාර්ඩ් සමාගම ලැබූ ආදායම;

(ii) ඔවුන් රජයට ගෙවූ බදු මුදල;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) සුවිශාල ලාභයක් ලබන මුහුදු ආරක්ෂක සේවය නාවික හමුදාවෙන් ඉවත් කිරීමට හා රාජ්‍ය දේපළ අවභාවිතයට හිටපු ආරක්ෂක ලේකම්වරයා ගත් තීරණය නිවැරදි කිරීමට කටයුතු කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

102/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නිල්වලා ගඟේ හා ගිං ගඟේ ජලය මහ හම්බන්තොට සංවර්ධන කලාපයට ගෙන යෑමේ ව්‍යාපෘතියට අනුව හම්බන්තොට දිස්ත්‍රික්කයට ගෙන යෑමට බලාපොරොත්තු වන ජල ප්‍රමාණය කොපමණද;

(ii) එම ව්‍යාපෘතියේ සැලසුම ඉදිරිපත් කරන්නේද;

(iii) මෙම ව්‍යාපෘතිය හේතුවෙන් ගාල්ල හා මාතර දිස්ත්‍රික්වල පරිසරයට සිදුවන බලපෑම පිළිබඳ පාරිසරික වාර්තාවක් සකස් කර තිබේද;

(iv) එසේ නම්, එම වාර්තාව ඉදිරිපත් කරන්නේද;

(v) මෙම ව්‍යාපෘතියෙන් නිල්වලා ගඟට කරදිය මිශ්‍රවීමේ අවදානම පාලනයට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මහ හම්බන්තොට ජල ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත වියදම කොපමණද;

(ii) එම මුදල් ලබා ගන්නා මූලාශ්‍ර කවරේද;

(iii) මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවා තිබේද;

(iv) එසේනම්, ටෙන්ඩර් ඉදිරිපත් කළ සමාගම්වල නම්, ලිපින, දුරකථන අංක හා විදේශ සමාගම් නම්, ඒවා අයත් රටවල් කවරේද;

(v) ඉදිරිපත් කළ ටෙන්ඩර්වල වටිනාකම් කවරේද;

(vi) ටෙන්ඩරය ප්‍රදානය කරන ලද සමාගම හා එයට හේතු කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) මහ හම්බන්තොට ජල ව්‍යාපෘතිය නිසා නිවාස ඇතුළු දේපළ අහිමිවන්නන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට ලබා දෙන සහන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

360/'15

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015දී පාසල් සිසුන්ට පාවහන් ලබාදීමට ටෙන්ඩර කැඳවනු ලැබුවේද;

(ii) ඒ සඳහා අයදුම් කළ සමාගම් කවරේද;

(iii) එම සමාගම් මූලික සුදුසුකම් සපුරා තිබේද;

(iv) සමාගම් ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) පසුගිය වසරවලදී සමාගම් කිහිපයකට ලබා දුන් ටෙන්ඩරය මෙවර DSI සමාගම වෙත පමණක් ලබාදී තිබේද;

(vi) වැඩිම මිල සඳහන් ටෙන්ඩරය ඉදිරිපත් කළේ DSI සමාගමද;

(vii) DSI ටෙන්ඩරය සඳහා කැබිනට් අනුමතිය ලබා ගෙන ඇත්තේ අවම මිල යැයි සඳහන් කිරීමෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ටෙන්ඩරය, පසුගිය වසරවල සමාගම් කිහිපයකට ලබා දුන්නේද;

(ii) එසේ නම්, ඒ මන්ද;

(iii) පසුගිය වසරේදී DSI සමාගමෙන් ලබාගත් පාවහන් යුගල ලක්ෂ 04, එම සමාගමෙන්ම සපයා තිබුණේද;

(iv) නොඑසේ නම්, වෙනත් සමාගමකින් පාවහන් යුගල 50,000ක් සපයා තිබුණේද;

(v) එවැනි තත්ත්වයක් යටතේ, එම ටෙන්ඩරය තනි සමාගමකට ලබා දුන්නේ මන්ද;

(vi) DSI වෙත ටෙන්ඩරය ලබාදීම හරහා මුදල් වංචාවක් හෝ රජයට පාඩුවක් නොවූ බවටත් සහතික විය හැකිද;

(vii) වංචාවක් සිදු වූ බවට හෙළිදරව් වුවහොත්, වැරදිකරුවන්ට දඬුවම් ලබා දීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

390/'15

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, සුනාමියෙන් පීඩාවට පත් ජනතාව සඳහා සෞදි අරාබියානු සංවර්ධන අරමුදලින්, අක්කරපත්තුව, නොරොච්චොලේ ගම්මානයේ නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලද බවත්;

(ii) එම නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසන් අදියරයේදී ප්‍රතිලාභීන් අතර බෙදාදීමට ප්‍රථමයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් අංක 178/2008 දරන නඩු නියෝගයක් මත නිවාස බෙදාදීම අත්හිටුවන ලද බවත්;

(iii) 2009.12.02 දින ප්‍රකාශයට පත්කරන ලද ඉහත නඩුවේ තීන්දුව ලබාදී වසර පහක කාලයක් ගත වී ඇති නමුත්, ඒ අනුව නිවාස බෙදාදීම සිදුකර නොමැතිවීමෙන් එම දේපළ සියල්ල මිනිස් පරිහරණයට නුසුදුසු අන්දමින් පරිහානියට පත් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත අ(iii)හි සඳහන් නඩු තීන්දුව අනුව කටයුතු කිරීමට නොපමාව උපදෙස් දෙන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

398/'15

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වසරේ සත්‍ය නැතහොත්, ඇස්තමේන්තු කළ දළ ජාතික නිෂ්පාදනය කොපමණද;

(ii) 2016 වසරේ පුරෝකථනය කළ දළ ජාතික නිෂ්පාදනය කොපමණද;

(iii) අයවැය ඇස්තමේන්තු ඉදිරිපත් කරන සම්ප්‍රදායික ක්‍රමය යටතේ, වර්ෂ 2013 සිට 2016 දක්වා අයවැයෙන් අධ්‍යාපනයට සහ සෞඛ්‍යයට වෙන් කළ මුදල්, දළ ජාතික නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2016 අයවැයෙන් හඳුන්වා දුන් අයවැය ඇස්තමේන්තු ඉදිරිපත් කරන නවීන ක්‍රමය යටතේ වර්ෂ 2013 සිට 2016 දක්වා අයවැයෙන් අධ්‍යාපනයට සහ සෞඛ්‍යයට වෙන් කළ මුදල් දළ ජාතික නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

437/'16

ගරු විජිත හේරත් මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් ඉවත්කර ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතට ගෙන තිබේද;

(ii) එසේ නම්, එමඟින් සේවකයන්ට මෙතෙක් ලබා දුන් රු. 4000/= පැමිණීමේ දීමනාව, වසර අවසාන ප්‍රසාද දීමනාව සහ රු.40,000/= මරණාධාර දීමනාව ආදී දීමනා ගණනාවක් අහිමි වන බව දන්නේද;

(iii) එම දීමනා නව ආයතනය මඟින් සේවකයන් හට ලබා දීමට හෝ වෙනත් ආකාරයකින් ප්‍රතිපූර්ණය කිරීමට එකඟ වන්නේද;

(iv) එසේ නොවේ නම්, සේවකයන්ට බලවත් අසාධාරණයක් සිදුවන බව පිළිගන්නේද;

(v) එම අසාධාරණය වැළැක්වීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් මෙම ආයතනය ඉවත්කළ පසු තනි ආයතනයක් ලෙස පවත්වා ගැනීම වෙනුවට ඩිපෝ 50ක් ලෙස යළි ඇරඹීමට සැලසුමක් සකස්කර තිබේද;

(ii) එසේ නම්, මෙම ඩිපෝ 50ට අලුතින් විදුලිය, ජලය, දුරකථන හා අනිකුත් වියදම් දරමින් ක්‍රියාත්මක කිරීම සඳහා විශාල පිරිවැයක් අවශ්‍යවන බව පිළිගන්නේද;

(iii) එවැනි පිරිවැයක් දැරීම වෙනුවට වෙනත් විකල්පයක් වෙත යොමුවීමට අදහස් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

440/'16

ගරු ඩී. වී. චානක මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් නිවාස සංවර්ධන වැඩසටහන යටතේ රුපියල් 250,000/=ක වටිනාකමින් යුත් නිවාස වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබුවේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම වැඩසටහන ක්‍රියාත්මක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

(ii) එම ඉඩම් ලබාදීමේදී දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව මඟින් අදාළ ඉඩම් කැබලි හඳුනාගැනීම සිදුකර තිබේද;

(iii) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව තෝරාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ප්‍රතිලාභීන්ගේ නම්, ලිපිනයන් සහ තෝරාගත් ක්‍රමවේදය කවරේද;

(v) ප්‍රතිලාභීන් තෝරාගැනීමට සහභාගි වූ රාජ්‍ය නිලධාරීන්ගේ නම් කවරේද;

(vi) තෝරාගත් ප්‍රතිලාභීන් ඉඩම් හිමිකමක් ලැබීමට නියම සුදුස්සන් බවට සෑහීමට පත්විය හැකිද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

444/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 ජනවාරි මස සිට විදුලි බිල්පත් ගාස්තුව කිසිදු දැනුම්දීමකින් තොරව වැඩිකර තිබේද;

(ii) ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලැබී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අලෝතියාව, වැල්මිල්ල හංදිය යන ලිපිනයෙහි පදිංචි සී. හෙට්ටිආරච්චි මහතාගේ නිවසෙහි 2015 ජනවාරි මස විදුලි බිල්පතේ (ගිණුම් අංක 3195478318), ඒකක 94 සඳහා ගාස්තුව රු.892.40ක් වූ අතර 2015 පෙබරවාරි මස විදුලි බිල්පතේ ඒකක 90ක් සඳහා ගාස්තුව රු.1,308.55ක් වී ඇත. මේ අනුව එක් මාසයක් තුළ එම විදුලි පාරිභෝගිකයාගේ විදුලි බිල රු.416.15කින් වැඩි වී ඇති බවත්;

(ii) එසේම, කුලියාපිටිය, හොරම්බාව යන ලිපිනයෙහි පදිංචි එම්. බී. එස්. පී. ප්‍රනාන්දු මහතාගේ නිවසෙහි 2014 දෙසැම්බර් මස විදුලි බිල්පත ඒකක 62ක් සඳහා ගාස්තුව රු.283.15 වූ අතර 2015 ජනවාරි මස විදුලි බිල්පත ඒකක 61ක් සඳහා ගාස්තුව රු.571/-ක් ලෙස වැඩි වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) මෙම විදුලි බිල්පත් ගාස්තු වැඩිවීම සිදු වී ඇත්තේ කෙසේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

446/'16

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, නාවලපිටිය අඩවියේ, සමනලගම ප්‍රදේශයේ පයිනස් ගස් 7000ක් කපා ඉවත් කරමින් සිටින බවත්;

(ii) නාවලපිටිය, මාපාකන්ද අක්කර 200කට සහ දොලොස්බාගේ, මල්ගොල්ල අක්කර 50කට අයත් පයිනස් ගස් පුද්ගලික වෙළෙඳුන් මඟින් කපා ඉවත් කිරීම සඳහා කටයුතු සූදානම් කර ඇති බවත්;

(iii) දොලොස්බාගේ, පරගල කොටසේ ගස් 2500ක් පමණක් ඉවත් කිරීමට අවසර ලබාගෙන ඇතත්, මේ වනවිට අනවසරයෙන් ගස් 12,000ක් පමණ කපා ඉවත් කොට ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් සියළුම ගස් ඉවත් කිරීම සඳහා අවසර ලබාදීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදයන් සහ ඒවාට සම්බන්ධ නිලධාරීන්ගේ නම් කවරේද;

(ii) එමඟින් රජයට අයවිය යුතු විශාල මුදලක් අහිමි වී ඇති බව පිළිගන්නේද;

(iii) එම වංචා සහගත ක්‍රියාවලට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව ගනු ලබන නීතිමය පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

455/'16

ගරු සිසිර ජයකොඩි මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තමන් අධ්‍යක්ෂ ධූරයක් දරන සමාගමක වංචාවක් සිදුවූ බවට පැමිණිලි කළ බ්‍රයන් ෂැඩික් නමැති පුද්ගලයාගෙන් ප්‍රකාශ ලබාගැනීම සඳහා පොලිස් දෙපාර්තමේන්තුවේ විශේෂ විමර්ශන ඒකකයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මෙවන් සිල්වා සහ පොලිස් පරීක්ෂක ගුණතිලක යන නිලධාරීන් 2015 දෙසැම්බර් මස ඔස්ට්‍රේලියානු සංචාරයක නිරත වූ බව දන්නේද;

(ii) එම සංචාරයට වැය වුණු මුදල කොපමණද;

(iii) එම සංචාරයට වැය කරනු ලැබුවේ මහජන මුදල්ද;

(iv) මීට පෙර පෞද්ගලික ආරවුලක පැමිණිලිකරුවෙකුගෙන් ප්‍රකාශයක් සටහන් කර ගැනීම සඳහා විශේෂ විමර්ශන ඒකකයේ නිලධාරීන් විදේශගත වී ඇත්නම්, එවැනි අවස්ථා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) (අ)(i)හි පැමිණිල්ල පිළිබඳ විමර්ශන කටයුතු පැමිණිලිකරුගේ ඉල්ලීම මත පොලිස්පතිවරයා විසින් අපරාධ පරීක්ෂණ කොට්ඨාසයෙන් විශේෂ විමර්ශන ඒකකයට මාරු කළ බව දන්නේද;

(ii) එම පැමිණිල්ල එසේ මාරු කිරීමට බලපෑ හේතුව කවරේද;

(iii) මීට පෙර පැමිණිල්ල පිළිබඳ විමර්ශන කටයුතු පැමිණිලිකරුගේ ඉල්ලීම මත අපරාධ පරීක්ෂණ කොට්ඨාසයෙන් විශේෂ විමර්ශන ඒකකයට මාරු කරන ලද අවස්ථා කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

503/'16

ගරු චතුර සංදීප සේනාරත්න මහතා,— රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ භාෂා පරිවර්තක සේවයේ විශේෂ පන්තියට උසස් කිරීමේ විභාගය 1999 වසරින් පසු මෙතෙක් පවත්වා නොමැති බවත්;

(ii) ඒ හේතුකොට ගෙන එකී විශේෂ පන්තියේ තනතුරු මේ වනවිට මුළුමනින්ම පුරප්පාඩු වී ඇති බවත්;

(iii) වසර 16කට වැඩි කාලයක් පුරා පවතින එකම උසස්වීමේ අවස්ථාවද අහිමි කිරීමෙන් නිලධාරීන්හට බලවත් අසාධාරණයක් සිදුවී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් 2006.01.01 දින සිට එම සේවයේ විශේෂ පන්තිය සේවා තත්ත්වයෙන් පහත හෙළන ලද බවත්;

(ii) ඒ අනුව, දීපව්‍යාප්ත සේවා මට්ටමේ තිබූ එම පන්තිය 2006 වසරේ සිට කළමණාකරන සහකාර අධි පන්තියටද පහළින් ස්ථානගත කරන ලද බවත්;

(iii) එම තත්ත්වය නිලධාරීන් සේවය හැරයාමටත්, උග්‍ර නිලධාරී හිඟයක් ඇති කිරීමටත් හේතුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) උසස්වීමේ අවස්ථාව අහිමි වූ එම නිලධාරීන්ට ලබාදෙන සහනය කවරේද;

(ii) නව සේවා ව්‍යවස්ථා කෙටුම්පතෙන් විශේෂ පන්තිය සඳහා 2006 වසරට පෙර පැවති සේවා තත්ත්වය නැවත ලබාදීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, එම ප්‍රතිපාදනයන් වහා ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

103/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010.01.01 දින සිට 2014.12.31 දින දක්වා කාලය තුළ කැනඩාවේදී හා ඇමරිකාවේදී මියගිය ශ්‍රී ලාංකික පුරවැසියන් සංඛ්‍යාව, එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, වයස, ශ්‍රී ලංකාවේ පදිංචි ලිපිනය හා උක්ත රටවල්හි දී කරන ලද රැකියා කවරේද;

(iii) මෙම පුද්ගලයින්ගේ මරණවලට ආසන්නතම හේතු කවරේද;

(iv) ඔවුන් වෙනුවෙන් රජය ලබා දුන් සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010.01.01 දින සිට 2014.12.31 දින දක්වා කාලය තුළ කැනඩාවේදී හා ඇමරිකාවේදී පූර්ණ සහ අර්ධ ආබාධිත තත්ත්වයට පත් වූ ශ්‍රී ලාංකික පුරවැසියන් සංඛ්‍යාව, එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, වයස, ශ්‍රී ලංකාවේ ලිපිනය හා උක්ත රටවල්හිදී ඔවුන් කළ රැකියා කවරේද;

(iii) මෙම පුද්ගලයින් ආබාධිත වීමට හේතු කවරේද;

(iv) ඔවුන් වෙනුවෙන් රජය ලබා දුන් සහන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

373/'15

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 වසර සඳහා පාසල් නිල ඇඳුම් රෙදි මිලදී ගැනීමට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළ දිනය කවරේද;

(ii) ඒ කවර රෙදි ප්‍රමාණයක් මිලදී ගැනීමටද;

(iii) ඒ සඳහා වෙන් කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iv) එම කැබිනට් පත්‍රිකාව අනුමත වූ දිනය කවරේද;

(v) ඒ අනුව ප්‍රසිද්ධියේ මිල ගණන් කැඳවීම් සිදු කළේද;

(vi) එසේ නම්, මිල ගණන් ඉදිරිපත් කළ සැපයුම්කරුවන් හා ඔවුන්ගේ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vii) 2016 වසර සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය නිල ඇඳුම් රෙදි මිලදී ගත් සැපයුම්කරුවන් කවරේද;

(viii) මිලදී ගත් රෙදි ප්‍රමාණය කවරේද; ඒ සඳහා ගෙවූ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රෙදි මිලදී ගැනීම වෙනුවට පාසල් නිල ඇඳුම් වවුචරයක් ලබාදීමට තීරණය කළ දිනය කවරේද;

(ii) පාසල් නිල ඇඳුම් රෙදි 25%ක් අවභාවිත වන බවට හෙළිවූයේ යැයි අධ්‍යාපන අමාත්‍යවරයා පවසන සමීක්ෂණ වාර්තාව සභාගත කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

399/'15

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2009 වසරේදී ගරු පාඨලී චම්පික රණවක අමාත්‍යතුමන්ගේ සංකල්පයක් යටතේ ආරම්භ කරන ලද දැනට ඔබගේ අමාත්‍යාංශය යටතේ පවතින සීමාසහිත පොලිප්ටෝ ලංකා (පෞද්ගලික) සමාගම විසින් 2010 වසරේ දී සාර්ථක ලෙස පොලිතීන් භාවිතා කර පෙට්‍රල් නිපද වූ බව දන්නේද;

(ii) එයින් වසර හයකට ආසන්න කාලයක් ගත වී ඇතත්, පොලිතින් භාවිතා කර නිපදවන පෙට්‍රල් වෙළඳපොළට නිකුත් කිරීමට නොහැකි වූයේ මන්ද;

(iii) පොලිතින් භාවිතා කර නිපදවන පෙට්‍රල් වෙළඳපොළට නිකුත් කිරීමට අපේක්ෂා කරන වකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 මැයි මස 19 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

104/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010.01.01 දින සිට 2014.12.31 දින දක්වා කාලය තුළ ඕස්ට්‍රේලියාවේදී හා ජපානයේදී මියගිය ශ්‍රී ලාංකික පුරවැසියන් සංඛ්‍යාව, එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, වයස, ශ්‍රී ලංකාවේ පදිංචි ලිපිනය හා උක්ත රටවල්හි දී කරන ලද රැකියා කවරේද;

(iii) මෙම පුද්ගලයින්ගේ මරණවලට ආසන්නතම හේතු කවරේද;

(iv) ඔවුන් වෙනුවෙන් රජය ලබා දුන් සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010.01.01 දින සිට 2014.12.31 දින දක්වා කාලය තුළ ඕස්ට්‍රේලියාවේදී හා ජපානයේදී පූර්ණ සහ අර්ධ ආබාධිත තත්ත්වයට පත් වූ ශ්‍රී ලාංකික පුරවැසියන් සංඛ්‍යාව, එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, වයස, ශ්‍රී ලංකාවේ ලිපිනය හා උක්ත රටවල ඔවුන් කළ රැකියා කවරේද;

(iii) මෙම පුද්ගලයින් ආබාධිත වීමට හේතු කවරේද;

(iv) ඔවුන් වෙනුවෙන් රජය ලබා දුන් සහන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

420/’16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා නිකුත් කරන ලද අත් පොතේ සඳහන් ආකාරයට, ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලවල එක් එක් පාඨමාලා සඳහා, 2010, 2011, 2012, 2013, 2014 සහ 2015 වර්ෂවලදී බඳවා ගැනීමට නියමිත වූ සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම වර්ෂවලදී ඉහත පාඨමාලා සඳහා සත්‍ය වශයෙන්ම බඳවාගත් සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එක් එක් පාඨමාලා සඳහා නියමිත ප්‍රමාණයට වඩා අඩුවෙන් බඳවාගෙන ඇත්නම්, ඒ සඳහා හේතු කවරේද;

(iv) එක් එක් පාඨමාලා සඳහා නියමිත ප්‍රමාණයට වඩා වැඩියෙන් බඳවාගෙන ඇත්නම්, ඒ සඳහා හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

427/’16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ සේවය කළ පොලිස් නිලධාරීන්ගේ නම්, තනතුරු, වෘත්තීය සුදුසුකම් සහ අධ්‍යාපනික සුදුසුකම් කවරේද;

(ii) 2015 දෙසැම්බර් 31 දිනට එකී කොට්ඨාසයේ සේවය කළ වරලත් ගණකාධිකාරිවරුන්, කළමනාකරණ ගණකාධිකාරිවරුන් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීන්ගේ සංගමයේ (Association of Accounting Technicians) සාමාජිකයින් සංඛ්‍යාව කවරේද;

(iii) මූල්‍ය අපරාධ විමර්ශනය නිසි පරිදි සිදු කිරීමට විගණනය සහ ගිණුම්කරණය පිළිබඳ වෘත්තීය සුදුසුකම් සහිත නිලධාරීන් අවශ්‍ය බව පිළිගන්නේද;

(iv) ඉහත (iii)හි සඳහන් සුදුසුකම් සහිත නිලධාරීන් මෙතෙක් බඳවා නොගැනීමට හේතු කවරේද;

(v) ඉදිරියේ දී එවැනි සුදුසුකම් සහිත නිලධාරීන් බඳවා ගැනීමේ වැඩපිළිවෙළක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

476/’16

ගරු කනක හේරත් මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යහපාලන රජය ආරම්භ වූ දින සිට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සමහර ඩිපෝවල සේවය කරන විවිධ තනතුරු දරන නිලධාරීන් හා සේවකයින් නොයෙකුත් අසාධාරණකම්, කරදර හා පීඩාවන්ට ලක්වී ඇති බවත්;

(ii) සමහර සේවකයින් දරන ලද තනතුරුවලින් ඉවත්කර ඇති බවත්;

(iii) එවැනි සේවකයින් අදාළ නොවන වෙනත් සේවාවල යොදවා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ක්‍රියාවලිය වර්තමාන යහපාලන රජයේ ප්‍රතිපත්තිවලට පටහැනි බව පිළිගන්නේද;

(ii) එසේ නම්, අසාධාරණයට, කරදර සහ පීඩාවන්ට ලක් වූ එවැනි සේවකයින්ට සාධාරණය ඉටු කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දැනුම් දෙන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

493/'16

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂය තුළදී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි කර ඇති, ආනයන සහ අපනයන දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද බලපත්‍ර මත ගෙන්වන ලද, කාලසීමාව ඉක්මවූ (overage) වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහන ලියාපදිංචි කර ඇති පුද්ගලයින්ගේ නම්, ලිපිනයන් සහ ලියාපදිංචි කළ අංකයන් වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

504/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) Lanka Marine Services Ltd. (LMSL) සමාගමේ වත්කම් අක්‍රමික ලෙස විකිණීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක SEFR209/2007 යටතේ ගොනුකර ඇති පෙත්සමට අදාළව ලබාදී ඇති නඩු තීන්දුවෙන් මතුකරනු ලැබූ කරුණු ගැන විමර්ශනයක් ආරම්භ කරන ලෙසට 2007.07.21 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත නියෝගකර තිබෙන බවත්;

(ii) එම විමර්ශන කටයුතු සිදුකර එහි උද්ධෘත නීති උපදෙස් සඳහා 2008.12.08 දින නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇතත්, මෙතෙක් ඊට අදාළ උපදෙස් ලැබී නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම උපදෙස් ලබාගැනීමට පියවර ගන්නේද;

(ii) එම තොරතුරු කවරේද යන්න මෙම සභාවට දැනුම් දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

510/'16

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2005 සිට 2015 දක්වා ශ්‍රී ලංකාවේ විදේශ සංචිත ප්‍රමාණය;

(ii) ඉහත එක් එක් වර්ෂයේදී විදේශ සංචිතයේ සංයුතිය සැකසී තිබූ ආකාරය (විදේශ ණය ගැනීම්, විදේශ භාණ්ඩාගාර සුරැකුම්පත් නිකුතුවලින් සහ වෙනත් අයුරින්);

එක් එක් වර්ෂය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

512/'16

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා,— ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ දිනවල ලෝක වෙළඳපොලේ බොරතෙල් මිල ගණන් අඩුම මට්ටමට පැමිණ ඇති බව එතුමා පිළිගන්නෙහිද;

(ආ) වර්තමානයේදී බොරතෙල් මිල අඩුම මට්ටමට පැමිණීම අනුව, සාධාරණ ලාභ ආන්තිකයක් සහිතව ඩීසල් ලීටරයක් රු. 31.00 කට ද පෙට්‍රල් ලීටරයක් රු. 52.00 ට ද පාරිභෝගිකයන් හට ලබාදීමට ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට හැකි බව එතුමා පිළිගන්නෙහිද;

(ඇ) (i) පසුගිය මැතිවරණ කාලය තුළදී ලබා දුන් පොරොන්දු ප්‍රකාරව ඩීසල් හා පෙට්‍රල් මිල ගණන් අඩු කිරීමට රජය විසින් තීරණය කරනු ලබන්නේ කවදාද;

(ii) මෙලෙස බොරතෙල් මිල ගණන් ඉතිහාසය තුළ අඩුම මට්ටමට පහත වැටීම සැලකිල්ලට ගෙන අපේක්ෂිත මිල අඩු කිරීම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

142/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 මුදල් වර්ෂය තුළ අලාභ ලැබූ රාජ්‍ය ආයතන කවරේද;

(ii) එම ආයතනයන්හි අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත (i) හි සඳහන් ආයතනයන්ගෙන් වෙනත් රාජ්‍ය ආයතනයන්ට ගෙවීමට ඇති මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අලාභ පියවීම සඳහා උක්ත ආයතනයන්ට මහා භාණ්ඩාගාරය මඟින් නිකුත් කළ මුදල් ප්‍රමාණය, එක් එක් ආයතනයන්ට වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) උක්ත අලාභයන්ට හේතු පිළිබඳ සොයා බැලීමක් කර තිබේද;

(iii) එසේ නම්, එම හේතු එක් එක් ආයතනයට වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) උක්ත ආයතනයන් ලාභදායී ආයතන බවට පත්කිරීමට පියවර ගන්නේද;

(v) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

421/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013, 2014 සහ 2015 වර්ෂ තුන තුළදී ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය හා සම්බන්ධ අධිකරණ ක්‍රියාමාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් නඩු කටයුත්ත භාරදුන් නීතිඥ සමාගම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එක් එක් නඩු කටයුත්ත සඳහා එම නීතිඥ සමාගම්වලට ගෙවා ඇති මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

431/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 දෙසැම්බර් 01 දින හෝ ඒ ආසන්න දිනයකදී මිලදී ගත් බොරතෙල් බැරලයක සාමාන්‍ය මිල කොපමණද;

(ii) බොරතෙල් බැරලයකින් නිපදවන විවිධ නිෂ්පාදන සහ ඒවායේ නිෂ්පාදන පිරිවැය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) බොරතෙල් බැරලයකින් නිපදවන විවිධ නිෂ්පාදනයන්හි විකුණුම් මිල සැලකීමේදී, 2015 දෙසැම්බර් 01 වන දින හෝ ආසන්න දිනයකදී මිල දී ගත් බොරතෙල් බැරලයක විකුණුම් මිල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව පෙට්‍රල් මිලදී ගන්නා වෙළඳපොළෙන් 2015 ජනවාරි 01 දින හෝ ඒ ආසන්න දිනයකදී මිලදී ගත් පෙට්‍රල් ලීටරයක සාමාන්‍ය මිල කොපමණද;

(ii) ඉන්ධන පිරවුම්හල් සඳහා පෙට්‍රල් නිකුත් කරන තුරු ලීටරයක් සඳහා දැරීමට සිදුවන පිරිවැය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) 2015 දෙසැම්බර් 01 දින මිලදී ගත් පෙට්‍රල් ලීටරයක් වෙළඳපොළට නිකුත් වන මුල්ම දිනය කවරේද;

(iv) ඉහත (ii) හි සඳහන් පෙට්‍රල් ලීටරයක සිල්ලර මිල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

477/'16

ගරු කනක හේරත් මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාවනැල්ල ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කාර්යාලය මඟින් දැනට පාරිභෝගික ජල සේවා සම්බන්ධතා සහ ජල නළ සේවා දීර්ඝ නොකරන බව දන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

(iii) මේ හේතුවෙන් මාවනැල්ල ප්‍රදේශයේ ජලය ලබා ගැනීමට අපේක්ෂිත ජනතාව දුෂ්කරතාවයට පත්වන බව පිළිගන්නේද;

(iv) එසේ නම්, දුෂ්කරතාවයට පත් ජනතාවට ජල සම්බන්ධතා ලබාදීමට හැකි කාලවකවානුව සඳහන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 මැයි මස 20 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

156/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වනජීවී දෙපාර්තමේන්තුවට අයත් වනාන්තර ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම වනාන්තරයන්හි නම් කවරේද;

(iii) එක් එක් වනාන්තරයන්හි විශාලත්වය වෙන් වෙන් වශයෙන් අක්කර කොපමණද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) උක්ත වනාන්තරයන්හි සීමා මායිම් ලකුණු කර තිබේද;

(ii) එසේ නම්, එම සීමා නිර්ණය කිරීම සිදු කරනු ලැබූ දිනය කවරේද;

(iii) නොඑසේ නම්, සීමා නිර්ණය කිරීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අ(ii)හි සඳහන් වනාන්තර තුළ මේ වනවිට නිවාස, සංචාරක කර්මාන්තයට අදාළ හෝටල් හෝ වෙනත් ඉදිකිරීම් තිබේද;

(ii) එසේ නම්, එම ඉදිකිරීම් හේතුවෙන් වනාන්තරයට සිදු වන බලපෑම පිළිබඳව අධ්‍යයනයක් සිදු කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

429/’16

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වෙනත් දිස්ත්‍රික්කවලට සාපේක්ෂව වැඩිම ජනගහණයක් වෙසෙන දිස්ත්‍රික්කය කොළඹ දිස්ත්‍රික්කය බවත්;

(ii) 2015 දෙසැම්බර් මස එළිදැක්වූ “ළඟම පාසල - හොඳම පාසල” වැඩසටහන යටතේ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් පාසල් 04ක්ද, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් පාසල් 03ක් ද තෝරාගෙන ඇති බවත්;

(iii) එම වැඩසටහන යටතේ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් තෝරාගෙන ඇත්තේ උතුරු කොළඹ කුමාර මහා විද්‍යාලය සහ මැද කොළඹ හේමමාලී විද්‍යාලය පමණක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මැද කොළඹ හා උතුරු කොළඹ මැතිවරණ කොට්ඨාස දෙක ආවරණය වන පරිදි පාසල් දෙකක් පමණක් තෝරා ගැනීම ප්‍රමාණවත් නොවන බවත්;

(ii) කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජනගහණයෙන් 70%ක් පමණ දෙමළ භාෂාව කථාකරන අතර, එකම දෙමළ මාධ්‍ය පාසලක්වත් තෝරා නොගැනීම අසාධාරණ බවත් එතුමා පිළිගන්නේද;

(iii) එසේ නොවේ නම්, ඒ සඳහා හේතු කවරේද;

(iv) උක්ත (i) සහ (ii) හි සඳහන් කරුණු නිවැරදි කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

432/’16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේදී මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ එක් එක් නිලධාරියා සහභාගි වූ පුහුණුවීම් සහ සම්මන්ත්‍රණ ඇතුළුව රාජකාරි සහ පෞද්ගලික විදේශ සංචාර ගණන වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත (i)හි සඳහන් රාජකාරි විදේශ සංචාරයන්හිදී එක් එක් නිලධාරියා විදේශගත වූ රටවල් සහ එම රටවල්හි ගත කළ දින ගණන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) 2015 වර්ෂයේදී මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ නිලධාරීන්ට පුහුණුවීම්, තාක්ෂණික දැනුම සහ දැනුවත් කිරීම් ලබා දුන් තානාපති/මහ කොමසාරිස් කාර්යාල සහ රාජ්‍ය නොවන සංවිධාන කවරේද;

(iv) 2016 වර්ෂයේදී එකී නිලධාරීන් සඳහා ලබාදීමට සැලසුම් කර ඇති දේශීය සහ විදේශීය පුහුණුවීම් සහ සම්මන්ත්‍රණ සඳහා අනුග්‍රහය දක්වන ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

441/'16

ගරු ඩී. වී. චානක මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් රුපියල් 50,000/= සහ රු. 100,000/= බැගින් වන නිවාස ණය වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නේද;

(ii) 2015 වර්ෂය සඳහා එම නිවාස ණය ලබාදුන් ණයලාභීන් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අදාළ ණයලාභීන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) ණය ලබාදීමේදී සලකා බලනු ලබන නිර්ණායක කවරේද;

(v) ණය ලබාදීම සඳහා දේශපාලන පක්ෂ ශාඛා සමිතියක නිර්දේශය ඉල්ලා සිටින බව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

447/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයිනෙහි ශිෂ්‍යයින් 3000ට වඩා ඉගෙනුම ලබන පාසල් කවරේද;

(ii) වර්ෂ 2011- 2015 දක්වා එම පාසල්වලින් පහ ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සමත්වී ඇති ශිෂ්‍යයින් සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම වසර පහ තුළ ඉහත කී පාසල්වල පහ වසර ශිෂ්‍යත්ව කඩඉම් ලකුණු වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම කඩඉම් ලකුණු අනුව බඳවා ගත් ශිෂ්‍යයින් සංඛ්‍යාව වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

460/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම, ජාතික පුනර්ජීවන වැඩසටහන අනුව, වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය, වයස අවුරුදු 70ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ලබාදුන් රුපියල් 2000/=ක මාසික දීමනාව, නව රජය බලයට පත්වීමෙන් පසුවත් 2015 වර්ෂය පුරා අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබුවේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2015 වර්ෂයේදී,

(i) එම දීමනාව ලබා දුන් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සංඛ්‍යාව;

(ii) එම දීමනාව ලබාදීම සඳහා වැය වූ මුදල;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) 2016 වර්ෂය ආරම්භවීමත් සමඟ උක්ත රුපියල් 2000/= මාසික දීමනාව, රුපියල් 1900/= දක්වා අඩුකර ඇති බව පිළිගන්නේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

479/'16

ගරු කනක හේරත් මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේදී, ශ්‍රී ලාංකිකයින් විසින් පරිභෝජනය කළ සීනි ප්‍රමාණය මෙට්‍රික් ටොන් කොපමණද;

(ii) පරිභෝජනය කරන ලද සීනි ප්‍රමාණයෙන් ආනයනය කළ සීනි ප්‍රමාණය කොපමණද;

(iii) ආනයනය කළ සීනි ප්‍රමාණයෙහි වටිනාකම කොපමණද;

(iv) දේශීය සීනි කර්මාන්තශාලාවලින් නිෂ්පාදනය කළ සීනි ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2014 සහ 2015 වර්ෂවලදී දේශීය සීනි කර්මාන්තශාලාවලින් නිෂ්පාදනය කරන ලද සීනි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2014 වර්ෂයට සාපේක්ෂව, 2015 වර්ෂයේදී සීනි නිෂ්පාදනයේ වැඩිවීමක් තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

505/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වසරේ ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් සිදු කරනු ලැබූ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන් කරුණු සොයාබැලීම සඳහා ත්‍රිපුද්ගල කමිටුවක් පත්කළ බවත්;

(ii) එම ත්‍රිපුද්ගල කමිටු වාර්තාවේ සඳහන් කරුණු මඟින් අපරාධ චෝදනාවක් අනාවරණය වන්නේද යන්න සම්බන්ධයෙන් උපදෙස් ලබාගැනීම සඳහා 2015.03.30 දින එම විමර්ශන ගොනු නීතිපතිතුමා වෙත යොමුකර ඇති අතර, ඊට අදාළ උපදෙස් මේ දක්වා ලැබී නොමැති බවත්;

(iii) එම උපදෙස් මෙතෙක් නොලැබීම නිසා, ඊට අනුකූලව ඉදිරි නෛතික ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම උපදෙස් වහාම ලබාගෙන නෛතික ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

158/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වනාන්තර තුළ පයිනස් හා ඉයුකැලිප්ටස් වගා කර ඇති ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් අක්කර කොපමණද;

(ii) මෙම වගාව නිසා පරිසරයට ඇති වාසි හා අවාසි කවරේද;

(iii) පයිනස් හා ඉයුකැලිප්ටස් වගාව නිසා ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ඇති ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පයිනස් හා ඉයුකැලිප්ටස් වෙනුවට දේශීය ශාකයක් වගා කිරීමට කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එම ශාක වර්ග මොනවාද;

(iii) නොඑසේ නම්, ඉදිරියේදී දේශීය ශාක වගා කිරීමට පියවර ගන්නේද;

(iv) ඒ සඳහා සැලසුම් සකස් කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

433/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2006 ජනවාරි 01 දිනට සහ 2016 ජනවාරි 01 දිනට ශ්‍රී ලංකා ආණ්ඩුවේ අමාත්‍ය මණ්ඩල සාමාජිකයින් වන අමාත්‍යවරුන්, අමාත්‍ය මණ්ඩල සාමාජිකයින් නොවන අමාත්‍යවරුන් සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් ගණන වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

450/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ව්‍යාපාර කළමනාකරණ පාසල (NSBM) ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එහි පළමු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ලෙස කටයුතු කළ පුද්ගලයින්ගේ නම් කවරේද;

(iii) ඕෂධී ජගත් කුමාර අලහප්පෙරුම හා එල්. පී. ජයතිස්ස යන පුද්ගලයින් එහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ලෙස කටයුතු කළ කාලය කවරේද;

(iv) එම කාලය තුළ ඔවුන් ලැබූ වැටුප් හා දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) මෙම ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

484/'16

ගරු කනක හේරත් මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාවනැල්ල සිට රඹුක්කන දක්වා මාර්ගය 'බී' ශ්‍රේණියට අයත් ඉතා පැරණි මාර්ගයක් බවත්;

(ii) එම මාර්ගයේ කොටසක් කාපට් දමා සංවර්ධනය කර ඇති බවත්;

(iii) එම මාර්ගයේ ඉතිරි කොටස අබලන්ව පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගයේ කාපට් දමා සංවර්ධනය කර ඇති දුර කොපමණද;

(ii) මාර්ගයේ ඉතිරි කොටස කාපට් දමා සංවර්ධනය කිරීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---